සැමට මානව අයිතිවාසිකම් සාම ක්‍රියාවලියෙහි දී
සුළුතර කොටස් සතු අයිතිවාසිකම් ව්‍යාපෘතිය

# සුළුතර කොටස්වල අයිතිවාසිකම් සහ සාම ක්‍රියාවලිය


දේවනේසන් නේසයියා



ශ්‍රී ලංකා
මානව හිමිකම් කොමිසම

අනුග්‍රහය : යුරෝපා සංගමය

ISBN 955 - 582 - 100 - 3

## නිදහස පූර්ණියයි

ජාතික ස්වෛරීභාවයේ නාමයට මුවා වී ජනතාවගේ මිනිස් අයිතිවාසිකම් හෝ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස හෝ උල්ලංඝනය කිරීමට කිසිම ආණ්ඩුවකට අයිතියක් නැත. පුද්ගලයකු අයත් වන්නේ සුළු ජන කොටසකට වුවත්, බහුතර ජන කොටසකට වුවත්, ඒ පුද්ගලයාගේ මිනිස් අයිතිවාසිකම් හා මූලික නිදහස පූර්ණියත්වයෙන් සැලැකිය යුතු ය.

**කොෆි අන්නන්**

**එක්සත් ජාතීන්ගේ මහ ලේකම්**

## මානව හිමිකම් බෙදා වෙන් කළ නොහැකිය

මිනිස් අයිතිවාසිකම් බෙදා වෙන් කිරීමට නොහැකිය. එහි අදහස නම් එක් අතෙකින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලටත්, අනෙක් අතින් ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්වලටත් එක හා සමානව සැලකිය යුතු බවයි. සෑම රටක්ම ඕනෑම නියමිත වකවානුවක දී තම සම්පත් ප්‍රයෝජනයට යොදා ගැනීම සඳහා ප්‍රමුඛත්ව කාර්යයන් තෝරා බේරා ගත යුතු බව සැබෑවි. එහෙත් නිශ්චිත මිනිස් අයිතිවාසිකම් අතරින් එකක් හෝ අනෙකක් හෝ විශේෂයෙන් තෝරා ගෙන ප්‍රමුඛත්වය දීමට නොහැකිය. එවැනි තෝරාගැනීමක් අප කිසිවෙක් නොකළ යුතුය. මේ අයිතිවාසිකම් එකිනෙකට සම්බන්ධිත බැවිනි. අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක මත රැඳා පවතින බැවිනි. බියෙන් හා අගහිඟකම්වලින් තොරව ජීවත්වීමේ නිදහස, කථා කිරීමේ හා ඇදහිල්ලේ නිදහස සමග වෙන් නොකළ හැකි ලෙසින් බැඳී තිබේ, අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය නිරෝගීකම සමග බැඳී තිබේ. මවකගේ සාක්ෂරතාවත් ඇගේ බිළිඳු දරුවන්ගේ සෞඛ්‍යයත් අතර පැහැදිලි සබඳතාවක් තිබේ.

**මේරි රොබින්සන්**

**මානව හිමිකම් පිළිබඳ, එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්**

acc 0343

# සුළුතර කොටස්වල අයිතිවාසිකම් සහ සාම ක්‍රියාවලිය

## පූර්විකාව

කුඩා ශ්‍රී ලංකා ද්වීපයේ ජනතාව පුදුමාකාර ලෙස විවිධාකාර වෙයි. විවිධත්වය ගැටුම්මට ඉඩකඩ සපයන බව හෝ එහි මහත් ධනාත්මක ඉඩ කඩක් ඇති වටිනා සම්පතක් බව හෝ අපට සිතිය හැක. අවුරුදු දෙදහසකට වැඩි කාලයක සිට ලෝ පතල ශ්‍රේෂ්ඨ ආගම් දෙකක් සහ පැරණි භාෂා දෙකක් අපට දායාද කොට තිබේ. ශත වර්ෂ බොහෝ කාලයකට පෙර වෙනත් ආගම් දෙකක් ද ශත වර්ෂ දෙකකට පෙර එක් ලෝක භාෂාවක් විසින් ද අප තවදුරටත් පොහොසත් කොට තිබේ. මේ සියල්ල සහ වෙනත් ආගම් සහ භාෂාවන් කීපයක් අපේ සංස්කෘතික සම්පතට දායක වී ඇති අතර අනිත් අතට ඒවා ශත වර්ෂාදී කාලයක් තිස්සේ ඉතාමත් කැපී පෙනෙන විදේශීය සාහිත්‍යමය දායාදයන් මගින් බොහෝ දේ ලබා ගෙන ඇත.

## ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ මිනුෂ්‍ය වාසය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවතුනි. තමන් මුල් පදිංචිකරුවන්ගෙන් පැවත එන්නන් බව වැද්දි ජනයා කියති. කෙසේ වෙතත් ඉන්දියාවේ බොහෝ ප්‍රජා කොට්ඨාස ශ්‍රී ලංකාවට සමීපවීමත් මුහුදු යෑමේ දීර්ඝ සම්ප්‍රදාය නිසාත් ස්ථිර හා තාවකාලික ලෙස ඉන්දියාවෙන් පැමිණි සංක්‍රමිකයන් නිසා අඩු තරමින් ක්‍රිස්තු පූර්ව පළමු සහශ්‍රයේ සිට මුල් පදිංචිකාර ජනතාවගේ ප්‍රමාණය වර්ධනය විය. බුද්ධාගම පැමිණීමට පෙර දිවයිනේ වැසියෝ ප්‍රානවාදීන් හෝ හින්දූන් වූහ. ක්‍රිස්තු උපතින් පසු පළමු සහශ්‍රයේ මුල් ශත වර්ෂ තුළ ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර බුද්ධාගම පැතිර ගියේය. පසුව එය හින්දු ආගමට පතු වූ නමුදු, දිවයිනේ බටහිර, දකුණේ සහ මධ්‍යම කොටසේ ජනතාවගේ ප්‍රධාන ආගම වශයෙන් එය පැවතුනි. අභ්‍යන්තර සහ බාහිර වශයෙන් බොහෝ සංක්‍රමණ දිගටම පැවතුනි. ඉන්දියාවේ සිට සහ ශ්‍රී ලංකාවේ අනිකුත් ප්‍රදේශවල සිට අළුතෙන් පැමිණි අය බොහෝ විට තමන් පදිංචියට පැමිණි ප්‍රදේශයේ ප්‍රධාන භාෂාව සහ ආගම භාර ගත්හ.

අඩුතරමින් ක්‍රි.පූ. හයවන ශත වර්ෂය දක්වාත් ආපස්සට යන්නාවූ ලේඛන ගත ඉතිහාසයක් ලංකාවට තිබේ. එහෙත් ඇගේ ඓතිහාසික සංවර්ධනයට පියවර සැපයූ ප්‍රධාන සම්ප්‍රදාය ජල මං දෙක තවත් දුර ආපස්සට ගොස් ඒවායේ ප්‍රභවය ඉන්දියාවෙන් ආරම්භ වෙයි. එනම් ලෝකයේ පෙර දිග භාගය තවමත් සිය ප්‍රබෝධය ලබන්නා වූ එම මාහැඟි සාංස්කෘතික ජලාශයෙන්ම ප්‍රභවය ලැබූ ඒවාය. මෙකී සම්ප්‍රදා ද්වයෙන් එකක ආරම්භය ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ ආධ්‍යාත්මික ධීමතකු මෙන්ම ලෝකයේ ශ්‍රේෂ්ඨතම පුත්‍රයන්ගෙන් කෙනෙකු වූ සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ සතු වෙයි. අනික් සම්ප්‍රදාය ඊට වඩා පැරණි වන අතර එය දකුණු ඉන්දියාවේ දර්ශන පීඨයාන්හි වර්ධනය වූ හිංදු සංස්කෘතික නියෝජනය කරයි. මේ එක් එක් සම්ප්‍රදාය ලංකාව තුළ විශේෂිත පෞද්ගලිකත්වයක් ගොඩ නැගීය. ඇත්ත වශයෙන්ම බෞද්ධ සම්ප්‍රදාය මෙහි කොතරම් පර්පූර්ණතාවක් අත්කර ගත්තේ ද යත් එහි දර්ශනය සහ භාවිත යන දෙආකාරයෙන්ම, බෞද්ධාගමේ උපත සිදුවූ භූමියෙන් එය පවනම් ඇදගිල්ලක් ලෙස අතුරුදන් වූ විට සියලු බෞද්ධ රටවල් විසින් මධ්‍යම ප්‍රතිපදා ආගමේ අධ්‍යාත්මික නිවස්නය ලෙස ලංකාව සලකනු ලැබීය. (කෝ. ණේසයියා The Mother Tongue in Education 1 වන පිටුව Ola books Colombo 1945)

යුරෝපා ජාතිකයන් පැමිණීමට පෙරාතුව වුව ද මධ්‍ය යුගයේ විවිධ කණ්ඩායම් වශයෙන් මුස්ලිම්වරුන්ගේ පැමිණීමත් සමග ජන විකාශන මෝස්තරයේ නව අංගයක් බිහිවිය සියලුම කණ්ඩායම් පාහේ දෙමළ කථා කරන අය වූ අතර සමාජයීය වශයෙන් සිංහල හා දෙමළ යන දෙවර්ගයෙන්ම වෙන් වූ විශේෂිත වර්ගයක් ලෙස සිටියහ. ඔවුන්ගේ ජනවාර්ගික භාවයේ ලකුණ වූයේ ඉස්ලාම් ආගමයි.

ඔවුන් අතර අරාබිවරුන් පර්සියානුවන්, ඊජිප්තුවන්, ඇබිසීනියන්වරුන් සහ ඉන්දියානුවන් ද වූ අතර ඔවුහු නැවියන්, වෙළඳුන්, සූෆිවරුන්, ෆකීර්වරුන්, දේශ සංචාරකයන් සහ වෙදවරුන් ද වූහ. ඔවුන් කිසිවෙක් ප්‍රදේශ අල්ලා ගැනීමට හෝ ආගමට හරවා ගැනීමට හෝ නොපැමිණි අතර ඔවුන් සියල්ල සෙරන්ඩිබ් හි වෙරළ ප්‍රදේශවලට ඇදී ආවේ බහුලව පැවති අධික

අඩුතරමින් ක්‍රි.පූ. හයවන ශත වර්ෂය දක්වාත් ආපස්සට යන්නාවූ ලේඛනගත ඉතිහාසයක් ලංකාවට තිබේ. එහෙත් ඇගේ ඓතිහාසික සංවර්ධනයට පියවර සැපයූ ප්‍රධාන සම්ප්‍රදාය ජල මං දෙක තවත් දුර ආපස්සට ගොස් ඒවායේ ප්‍රභවය ඉන්දියාවෙන් ආරම්භ වෙයි. එනම් ලෝකයේ පෙර දිග භාගය තවමත් සිය ප්‍රබෝධය ලබන්නා වූ එම මාහැඟි සාංස්කෘතික ජලාශයෙන්ම ප්‍රභවය ලැබූ ඒවාය. මෙකී සම්ප්‍රදා ද්වයෙන් එකක ආරම්භය ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ ආධ්‍යාත්මික ධීමතකු මෙන්ම ලෝකයේ ශ්‍රේෂ්ඨතම පුත්‍රයන්ගෙන් කෙනෙකු වූ සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ සතු වෙයි. අනික් සම්ප්‍රදාය ඊට වඩා පැරණි වන අතර එය දකුණු ඉන්දියාවේ දර්ශන පීඨයන්හි වර්ධනය වූ හිංදු සංස්කෘතික නියෝජනය කරයි. මේ එක් එක් සම්ප්‍රදාය ලංකාව තුළ විශේෂිත පෞද්ගලිකත්වයක් ගොඩ නැගීය. ඇත්ත වශයෙන්ම බෞද්ධ සම්ප්‍රදාය මෙහි කොතරම් පරිපූර්ණතාවක් අත්කර ගත්තේ ද යත් එහි දර්ශනය සහ භාවිත යන දෙආකාරයෙන්ම, බෞද්ධාගමේ උපත සිදුවූ භූමියෙන් එය වෙනම ඇදහිල්ලක් ලෙස අතුරුදන් වූ විට සියලු බෞද්ධ රටවල් විසින් මධ්‍යම ප්‍රතිපදා ආගමේ අධ්‍යාත්මික නිවසනය ලෙස ලංකාව සලකනු ලැබීය. (කේ. ජේසයියා The Mother Tongue in Education 1 වන පිටුව Ola books Colombo 1945)

යුරෝපා ජාතිකයන් පැමිණීමට පෙරාතුව වුව ද මධ්‍ය යුගයේ විවිධ කණ්ඩායම් වශයෙන් මුස්ලිම්වරුන්ගේ පැමිණීමත් සමග ජන විකාශන මෝස්තරයේ නව අංගයක් බිහිවිය සියලුම කණ්ඩායම් පාහේ දෙමළ කථා කරන අය වූ අතර සමාජයීය වශයෙන් සිංහල හා දෙමළ යන දෙවර්ගයෙන්ම වෙන් වූ විශේෂිත වර්ගයක් ලෙස සිටියහ. ඔවුන්ගේ ජනවාර්ගික භාවයේ ලකුණ වූයේ ඉස්ලාම් ආගමයි.

ඔවුන් අතර අරාබිවරුන් පර්සියානුවන්, ඊජිප්තුවන්, ඇබිසීනියන්වරුන් සහ ඉන්දියානුවන් ද වූ අතර ඔවුහු නැවියන්, වෙළඳුන්, සූෆිවරුන්, ෆකීර්වරුන්, දේශ සංචාරකයන් සහ වෙදවරුන් ද වූහ. ඔවුන් කිසිවෙක් ප්‍රදේශ අල්ලා ගැනීමට හෝ ආගමට හරවා ගැනීමට හෝ නොපැමිණි අතර ඔවුන් සියල්ල සෙරන්ඩිබ් හි වෙරළ ප්‍රදේශවලට ඇදී ආවේ බහුලව පැවති අධික

වටිනාකමින් යුත් තුළු බඩු, මුතු, ඇත් දළ සහ මැණික් නිසාය. ශ්‍රී පාද කන්දේ පූජනීය ශ්‍රී පාද ලාංඡනය ද අතිරේක ආකර්ෂණයක් විය. ජනවාර්ගික ප්‍රභවය සහ පැමිණීමට හේතු වූ කාරණය අතින් මුල් ආගන්තුකයන් විවිධාකාර වූ කණ්ඩායම්ය් වුව ද ආගමික විශ්වාසය සහ අධ්‍යාත්මික භාවිත අතින් බලන විට විශාල පිරිසක් ඉස්ලාම් ආගමේ සුන්නි නිකායට අයත් වූවන් විය. එම නිසා පොදුවේ කල්පනා කරන විට ඔවුන් සියලු දෙනාම මුස්ලිම්වරුන් වූ අතර එය ඔවුන්ගේ සමූහ අනන්‍යතාවය ද විය. (කොළඹ මාර්ග ආයතනයේ 2001 පොත් පිංච පෙළේ අමීර් අලි විසින් රචිත Plural Identities and Political Choices of the Muslim Community නමැති පොත් පිංචේ පිටු 1 සහ 2).

බ්‍රිතාන්‍ය යුගයේ බොහෝ කලක් යන තුරුත් එමෙන්ම නිදහසෙන් පසු මුල් වර්ෂ තුළත් සිංහල සහ දෙමළ අනන්‍යතා දියාරු ස්වභාවයක් ඉසිලූ අතර මායිම් ද ප්‍රබල අන්දමින් නිශ්චිත නොවිය. ජනවාර්ගික භාවය සහ ජාතික භාවය සම්බන්ධයෙන් පවතින්නාවූ යුරෝපීය සංකල්ප, සිංහල, දෙමළ, මුස්ලිම් අනන්‍යතා නිර්ණය කිරීමට සහ වර්ධනය කිරීමට දායක වූ අතර දිවයින තුළ අන්තර්වාර්ගික සංචරණයට එමගින් ප්‍රබල අන්දමින් බාධා ද පමුණුවන ලදී. පාසැල්වල කාර්යයන් සඳහා "මව් බස" සහ ආගම් ප්‍රකාශ කිරීම, සංගණන, උපත් ලියාපදිංචිය ආදි කටයුතු සඳහා "වර්ගය" හා ආගම ප්‍රකාශ කිරීම වැනි වූ ආයතනික අවශ්‍යතා ද මේ කාරණයට දායක විය.

යුරෝපීය ජනපදකරුවන්ගේ පැමිණීමත් සමග පෘතුගීසීන් විශාල ගණනක් ද ලන්දේසීන් සැලකෙන සංඛ්‍යාවක් ද එසේත් අඩු ප්‍රමාණයක බ්‍රිතාන්‍යවරුන් ද ජන සංඛ්‍යාවට ඇතුළත් වූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පසු කාලයේ සිංහල හා අනිකුත් ජනවාර්ගික කණ්ඩායම් සමග මිශ්‍රවීම හෝ රටින් පිටවීම සිදුවූ අතර ඉතිරි වූයේ ඉතා සුළු (යුරේසියන්) බර්ගර් ජන කොටසකි. විවිධ ක්‍රිස්තියානි ආගමික නිකායන්වලට (වැඩි දෙනා රෝමානු කතෝලික ආගමට) හැරුණු සිංහල හා දෙමළ ජන සංඛ්‍යාව බෙහෙවින් විශාල වූ අතර, ඉස්ලාම් ආගමට හැරුණු පිරිස් මෙන් නොව, මේ පිරිස් ඔවුන්ගේ මුල් ජනවාර්ගික අනන්‍යතාවය පවා ගත්හ. මෙසේ හැරුණු අයගෙන් සැලකෙන සංඛ්‍යාවක් කාලයාගේ ඇවෑමෙන් නැවතත් බුද්ධාගමට හෝ හිංදු ආගමට ආපසු ගිය නමුදු බොහෝ සංඛ්‍යාවක් ක්‍රිස්තු භක්තිකයන් වශයෙන් රැඳී සිටිති.

යටත් විජිත සමයේ ශත වර්ෂ 4 කට වැඩි කාලයක් තුළ ඉන්දියාවෙන් ද ඊට වඩා අඩුවෙන් ඉන්දුනීසියාවෙන් ද දිගටම ආගමන සිදුවිය. ඉන්දුනීසියානු ආගමනිකයන් මුස්ලිම් වූ අතර ඔවුන් මැලේ යනුවෙන් හඳුන්වන ලදි. ඉන්දියානු ආගමනිකයන්ගෙන් වැඩි කොටස දැන් දෙමළෙන් "මලෙයිහා" වශයෙන් හඳුන්වනු ලබන "ඉන්දියානු දෙමළ" අය වූහ. සඳහන් කරන ලද පරිදි:

> හැඳින්වීමේ නියමිත නමක් ඉංග්‍රීසි බසින් නොමැතිවීම නිසා මලෙයිහා දෙමළ ජනයා ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලනයට, සංස්කෘතියට හා සමාජයට අනුකලනය කර ගැනීමේ අනියම් ස්වභාවය පෙන්නුම් කරයි. ඔවුන් අවුරුදු 160 කට වැඩි කාලයක් තුළ ශ්‍රී ලාංකික ආර්ථිකයේ කොඳු ඇටය නොවේ නම් එහි අනුකලක කොටසක් වූ නමුදු මලෙයිහා දෙමළ ජනයා ශ්‍රී ලාංකික දේශපාලනයේ කොටසක් වශයෙන් ක්‍රම ක්‍රමයෙන් සම්බන්ධවී ඇත්තේ ඉකුත් වර්ෂ විස්ස හෝ තිහ ඇතුළත පමණි. (ඩැනියෙල් බාස්ගේ Landscapes of Malaiyaha Tamil Identity පිටු 6 සහ 7 - 2001 කොළඹ මාර්ග ආයතනයේ පොත් පිංච පෙළ)

ශ්‍රී ලංකාවේ සිංහල හා ශ්‍රී ලංකා දෙමළ සහ මුස්ලිම්වරුන් මෙන් නොව ඉන්දියානු දෙමළ ජනයා කොන් කිරීම පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් තිබේ. 1948 පුරවැසි පනත සහ ඊට පසු 1949 පකිස්ථානු වැසියන්ගේ (පුරවැසිභාවය) පනත මගින් ඔවුන්ගේ පුරවැසිභාවය සහ ඡන්ද අයිතිය හා අවසානයේ දී ස්ථිර පදිංචියට අයිතිය අහෝසි කරන ලදි. නෛතික ක්‍රියා මාර්ග සහ ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම් ගණනාවක් අනුව, මෙම වර්ගයේ ජනයාගෙන් අඩකට තරමක් වැඩියෙන් ඉන්දියාවට "ආපසු යැවීමට" (නිර්වාස කිරීමට)ත්, ඉතිරි සිටින පිරිසට පියවරෙන් පියවර පුරවැසිභාවය ලබාදීමටත් කටයුතු කරන ලදි. නීති ප්‍රකාර බලන විට රටක් නොමැති මෙම කොටස තුරන් කිරීමේ ක්‍රියාවලිය දැන් සම්පූර්ණයෙන්ම පාහේ අවසන්වී තිබේ. එහෙත් ක්‍රියාත්මක පැත්තෙන් බලන විට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබූ අය අනුකලනය කිරීමේ ක්‍රියාවලිය තවමත් අසම්පූර්ණව පවතී. නිදහස ලබන අවස්ථාවේදී ඉන්දියානු දෙමළ ජන ගහනය ශ්‍රී ලාංකික දෙමළ ජනගහනයට වඩා මදක් වැඩි විය. ඉන්දියානු දෙමළ ජන අනුපාතය දැන් එවකට පැවති ප්‍රමාණයෙන් අඩකට වඩා අඩු අතර දිවයිනේ මුළු දෙමළ ජනගහනයෙන් තුනෙන් එකකට වඩා අඩුය.

මෙම වර්ගයෙන් 90% කට වැඩියෙන් එක්කෝ ඉන්දියාවට ආපසු ගොස් හෝ ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබා ගෙන ඇති අතර තවමත් ඉතිරි වූ කොටස් වර්ග දෙකක් ඇත. පළමු වර්ගය ඉන්දියානු දෙමළ පුරවැසියන් ලෙස වර්ගකර ඇතත් ආපසු යාමට කැමති නැති අතර දෙවන වර්ගය වූ කලී පුරවැසි තත්ත්වය ගැන තවමත් තීරණයක් ගෙන නොමැති සුළු ප්‍රමාණයකි; එනම් ඔවුහු පුරවැසිභාවය නොමැතිව සිටිති. කෙසේ වෙතත් ප්‍රමුඛ අවධානයක් අවශ්‍යව තිබෙන ලොකුම ප්‍රශ්නය වන්නේ ශ්‍රී ලාංකික පුරවැසි භාවය ලබා සිටින අය ද ඇතුළුව සියලු ප්‍රජාවට (9,00000 ක් පමණ වන) ආර්ථික, සමාජ සාංස්කෘතික සහ දේශපාලන ප්‍රධාන ප්‍රවාහයට උකහා ගැනීමයි.

## ජනගහනය සහ භූගෝලීය බෙදීයාම

සම්පූර්ණ කර ඇති අවසාන ජන සංගණනය පැවතියේ 1981 දී ය. එම සංගණනය අනුව, මධ්‍යම පළාතේ නුවරඑළිය, ඌව පළාතේ බදුල්ල, සහ උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්කවල හැර අනිකුත් සෑම දිස්ත්‍රික්කයකම සිංහල ජනයා ජනගහනයෙන් 74% කට වැඩි විය. මධ්‍යම පළාතේ සමස්තයක් වශයෙන් ඔවුහු 64% කට වැඩි වූ අතර ඌව පළාතේ 73% කට වැඩි විය. 2001 වන විට මෙම පළාත් දෙකේ සිංහල ජනගහනය තව්දුරටත් පිළිවෙලින් 65.3% සහ 79.6% වශයෙන් වැඩි වී තිබේ.

1981 දී ශ්‍රී ලාංකික දෙමළ ජනයා කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 10% ක් ද නුවරඑළියේ 12.7% ක් ද උතුරේ හා නැගෙනහිර හැර අනිකුත් සෑම දිස්ත්‍රික්කයකට 7% කට අඩුවෙන් ද විය. උතුරේ සෑම දිස්ත්‍රික්කයකම සහ මඩකලපුවේ ද ඔවුහු පැහැදිලිවම බහුතරයක් වූහ. උතුරු පළාතේ දෙමළ ජනයා 86% ක් ද මුස්ලිම්වරුන් 5% ක් ද සිංහල ජනයා 3% ද විය. මුස්ලිම් සහ සිංහල ජනයා සැලකෙන කොටසක් සිටි ත්‍රිකුණාමලයේ ඔවුහු විශාලම ජනවාර්ගික කණ්ඩායම විය. මුස්ලිම් ජනයා වැඩියෙන්ම ද සිංහල ජනයා ද විශාල ප්‍රමාණවලින් සිටි අම්පාරේ දෙමළ ජනතාව දෙවෙනි වැඩිම කොටස විය. නැගෙනහිර පළාත තුළ සමස්තයක් වශයෙන් දෙමළ ජනයා 41% ක් ද මුස්ලිම්වරුන් 32 % ක් ද සිංහල 25% ක් ද විය. මුස්ලිම්වරුන්ගෙන් වැඩිම අනුපාතය (41.6%) අම්පාර දිස්ත්‍රික්කයේ විය. තාවකාලිකව සම්බන්ධ කර ඇති උතුරු-නැගෙනහිර පළාතේ ඒකාබද්ධ ජන ගහනයෙන් 65% ක් දෙමළ ද 18% ක් මුස්ලිම් ද 13% ක් සිංහල ද විය.

නිදහස ලැබීමට පෙරාතුව උඩරට සිංහල සහ පහත රට සිංහල ජනයා අතර දේශපාලන, සමාජ හා ආර්ථික අංශ ගණනාවක් තුළ දීර්ඝකාලීන වෙනසක් තිබූ නමුදු, එයින් පසුව මෙම වෙනස ක්‍රමික ලෙස පහ වෙමින් තිබේ. ඒ අනුව සසඳන විට, නිදහස ලැබීමට ආසන්නයේ සියලු සුළුතර ජන කොටස් අතර දේශපාලන සන්ධානයක් ගොඩනැගීමට උත්සාහයක් ද දෙමළ කථා කරන ප්‍රජා කොට්ඨාස තුන, එනම් ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ සහ මරක්කල ජනයා, අතර නිදහසට පසු මුල් කාලයේ දී උත්සාහයක් ද තිබූ නමුත් මෙම උත්සාහයන් අසාර්ථක විය. අසාර්ථක වීමට අර්ධ වශයෙන් හේතු වූයේ කොළඹ සහ යාපනයේ ජීවත් වී සිටින ශ්‍රී ලංකා දෙමළ ජනයා අධිපති තත්ත්වයක් උසුලනු ඇතැයි යන බිය නිසාය. දෙමළ භාෂාව කථා කරන ප්‍රධාන කොටස් තුන දේශපාලන වශයෙන් වෙනම පවතී, එහෙත් මරක්කල සහ මැලේ ජාතීන් ඇතුළු නව මුස්ලිම් වර්ගයක් එළිදැක්වී සිටී.

ඉන්දියානු දෙමළ ජනයා රටක් නැති තත්ත්වයට පත්කිරීමේ අනපනත්වලට ශ්‍රී ලංකා දෙමළ හා මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් ඡන්දය දී ඇත. එසේ කිරීමෙන් දේශපාලන තුල්‍යත්වය කැපී පෙනෙන අන්දමින් බහුතරයේ අධිපති භාවය පැත්තට බරකිරීමට ද 1950 ගණන්වල ජනවාර්ගික අර්බුද ඇති කිරීමට ද ඔවුහු සහාය වූහ. නිදහස ලැබීමත් සමඟම ඉන්දියානු දෙමළ ජනයා රටක් නොමැති තත්ත්වයට පත්වීමේ වේදනාවට වර්ග කිහිපයකට පසුව (සියලු දෙමළ කථා කරන පුද්ගලයන්ගේ තත්ත්වයට සහ අවස්ථාවලට බලපෑවාවූ ) සිංහල පමණක් යන ප්‍රතිපත්ති සහ ( දෙමළ ජනයා අතර බොහෝ ජීවිත හා දේපල විනාශ සහ ශාරීරක අනාරක්ෂාව ඇති කළ) 1956 සහ 1958 කැරලි කෝලාහල ඇති විය. මෙම සිද්ධීන් අලුත් ගැඹුරු දේශපාලන හා සමාජ වෙනස්කම්වලට සහ ජනවාර්ගික ගැටුම් උග්‍රවීමට මං පෑදී තිබේ.

නුවරඑළිය ජනගහනයෙන් 42.7% ක් ද බදුල්ලේ 20.2% ක් ද එනිසුත් දිස්ත්‍රික්කවල 20% අඩුවෙන් ද වූ ඉන්දියානු දෙමළ ජනතාව (යාපනය, මන්නාරම, වව්නියාව, මුලතිව්, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක ආවරණය නොවූ) 2001 ජන සංගණනය අනුව පිළිවෙලින් 21.3% ක් සහ 18.2% ක් දක්වා පහත වැටී තිබුණි. මෙම අඩුවීම, ඉන්දියාවට සංක්‍රමණය වීම, උතුරට සහ නැගෙනහිරට අභ්‍යන්තර වශයෙන් සංක්‍රමණය වීම සහ, විය හැකි පරිදි ශ්‍රී ලාංකික දෙමළ වශයෙන් නැවත වර්ගකිරීම යන කාරණා හේතු කොට ගෙන සිදුවන්නට ඇත. ඇතැම් විට ඉන්දියානු දෙමළ ජනයා ශ්‍රී ලාංකික

සමාජයට අනුකලනය වීමේ ආරම්භය ශ්‍රී ලංකා දෙමළ සහ ඉන්දියානු දෙමළ යන ජනවාර්ගික දෙකොට්ඨාසය අනුකලනය වීම තුළින් ආරම්භවීම අවශ්‍ය වීමට හැක. එහෙත් මෙය වූ කලී හෙමින් සිදුවන අසීරු ක්‍රියාවලියක් වීමට පුළුවන.

ආගම අනුව බලන විට ප්‍රධාන වර්ග හතරක් තිබේ. සියල්ලම පාහේ සිංහලයන් වන බෞද්ධයන් 1981 සංගණනයේ දී 69.3% ක් විය. ශ්‍රී ලාංකික දෙමළ සහ ඉන්දියානු දෙමළ කොටස්වලින් බොහෝ සේ සමන්විත වන හිංදු භක්තිකයන් ජනගහනයෙන් 15.5% ක් විය. මුස්ලිම්වරුන් (මරක්කල සහ මැලේ) 7.5% ක් ද ක්‍රිස්තියානිවරුන් 7.6% ක් ද විය. සිංහලයන් අතුරෙන් 6.2% ක් ද දෙමළ දෙවර්ගයෙන් 13% කට මඳක් වැඩියෙන් ද ක්‍රිස්තියානිවරු වූහ. ක්‍රිස්තියානිවරු සම අනුපාතික නොවන ආකාරයට බස්නාහිර දිස්ත්‍රික්වලට සහ උතුරේ මුහුදුබඩ ප්‍රදේශවල ඒකරාශිවී සිටිති. ඔවුහු මන්නාරමේ 42.1% ක් ද, පුත්තලමේ 37.9 % ක් ද, ගම්පහ 23.4% ක් ද මුලතිව්වල 15.8% ක් ද, යාපනයේ 12.6 % ක් සහ කොළඹ 11.6 % ක් ද වශයෙන් වෙති. සමස්තයක් වශයෙන් ක්‍රිස්තියානුවන්ගෙන් 90 % ක් පමණම රෝමානු කතෝලිකයෝ වෙති.

අමුනා ඇති අංක 1 වගුව 1981 සහ 2001 දිස්ත්‍රික්ක අනුව ආගමික කොටස් බෙදී තිබූ සියයට ගණන ද අංක 2 වගුව 1981 සහ 2001 ජනවර්ගය අනුව බෙදීමේ සියයට ගණන ද පෙන්නුම් කරයි.

## දේශපාලන කටයුතු

විසිවන සිය වස පුරාම ශ්‍රී ලාංකික දෙමළ විඥානයේ කේන්ද්‍රස්ථානය වශයෙන් පුළුල් ලෙස හඳුනාගෙන තිබූ යාපනය, මුලින්ම ඇති වූ ඉතාමත් සටන්කාමී දීප ව්‍යාප්ත නැඹියාවකින් යුත් ජාතිවාදී ව්‍යාපාරය ද ඇති කළාය. තිස් ගණන්වල මුල් කාලයේදී උච්චස්ථානයට පත් යාපනයේ තරුණ කොන්ග්‍රසය කුල ක්‍රමයට එරෙහිව ව්‍යාපාරයක් ගෙන ගිය අතර සංඝීය ක්‍රමයට විරුද්ධවී (හේතු සඳහන් නොවිය-ඇතැම් විට මෙම විකල්පය ගැන උනන්දුවෙන් සොයා නොබැලුවා විය හැක). ඔවුහු එක්සත් ශ්‍රී ලංකාවක් සඳහා කඩිනම් ස්වාධීනත්වයක් ඉල්ලා සිටි අතර ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ඉතා අල්ප හා ඉතා ප්‍රමාද බව දක්වමින් ඒවා ප්‍රතික්ෂේප කළහ. මෙම සංවිධානයේ සාමාජිකත්වය උසුලන ලද්දේ ප්‍රධාන වශයෙන් තරුණ ජනයා විසිනි. වැඩි දෙනා වයස විසි ගණන්වල මුල් භාගයේ සිටි පාසල් ගුරුවරු සහ පාසැල් සිසුහු වූහ.

පිටස්තර සම්බන්ධතා ඇතුළත් කර ගැනීමෙන් හෝ ඇති කිරීමෙන් සිය අර්ධද්වීපය සීමාවෙන් එය ගැනීමට යාපන තරුණ කොංග්‍රසය උත්සාහ කළාය. මෙම කොංග්‍රසය සමග සම්බන්ධකම් තිබූ ජාතික නායකයන් අතර එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සී.ඊ. කොරයා, ඩබ්ලිව්. දහනායක, එස්.ඩබ්ලිව් දසනායක, කොල්වින් ආර්. ද සිල්වා, ජෝර්ජ් ඊ ද සිල්වා, ෆැන්සිස් ද සොයිසා, ඩී.බී. ධනපාල (ආරම්භ කිරීමට සම්බන්ධ විය), ඒ.ඊ. ගුණසිංහ, ලෙස්ලි ගුණවර්ධන, පිලිප් ගුණවර්ධන, ටී.බී. ජයා, ඩී.බී. ජයතිලක, ජේ.ආර්. ජයවර්ධන, පී. ද එස්. කුලරත්න (1925 වාර්ෂික සම්මේලනයේදී සභාපති වශයෙන් තෝරාපත් කර ගැණිනි.), ඊ.ඩබ්ලිව්. පෙරේරා (1929 වාර්ෂික සම්මේලනයේදී සභාපති වශයෙන් තෝරා පත්කර ගැණිනි.), ඒ.කේ.ඩබ්ලිව් පෙරේරා, ඇන්.ඇම්. පෙරේරා, සෙලිනා පෙරේරා (1941 වාර්ෂික සම්මේලනයේදී ඇය විසින් කරන ලද කථාව හේතුවෙන් රාජ්‍ය ද්‍රෝහය පිළිබඳ වරදට ඇයට එරෙහිව නඩු පවරන ලදී), ඩී.එස්. සේනානායක, පෙරි සුන්දරම්, ස්වාමි විපුලානන්ද (1928 වාර්ෂික සම්මේලනයේදී සභාපති වශයෙන් තෝරා පත් කර ගැණිනි.) සහ එස්.ඒ. වික්‍රමසිංහ යන අය වූහ.

අධ්‍යාපනය සහ රාජ්‍ය කරණය සඳහා ජාතික භාෂා භාවිතා කරන ලෙස යාපන තරුණ කොංග්‍රසය විසින් නිදහස ලැබීමට බොහෝ කලකට පෙර උද්ඝෝෂණයක් ගෙන යන ලදී. යාපනයේ සියලු ප්‍රධාන පාසැල්වල පාහේ ද්විතීය මට්ටමේදී අනිවාර්ය විෂයයක් ලෙස සිංහල භාෂාව ඉගැන්වීමට යොමු කර ගැනීමට යාපන තරුණ කොංග්‍රසය සමත් විය. ජේ.ඊ. ජයසූර්ය සඳහන් කර ඇති පරිදි "සිංහල නොමැතිව කටයුතු කිරීමට සිංහල ජනයා සූදානම්ව සිටි එකවානුවක සිංහල සහ දෙමළ සඳහා වූ සටන ගෙන ගියේ දෙමළ නායකයන් ය" (ජයසූරිය 1981:152). දෛවයේ සරදමක් ලෙස එකම රාජ්‍ය භාෂාව සිංහල ලෙස තීරණය කිරීමට ප්‍රතික්‍රියාවක් ලෙස යාපනයේ පාසැල්වල සිංහල ඉගැන්වීම 1956 දී හිටි ගමන් නතර කරන ලදී. යාපන තරුණ කොංග්‍රසය අභිබවා ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාගේ දේශපාලන නායකත්වය භාර ගත් දෙමළ කොංග්‍රසය තරුණ කොංග්‍රසයේ ජාතික භාෂා ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන ගියේ නැත. ලංකා ජාතික කොංග්‍රසයේ/එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය පරිදි, ප්‍රධාන පාසැල්වල ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් සහ රාජ්‍ය පාලනයේ භාෂාව වශයෙන් ඉංග්‍රීසි දිගටම තබා ගැනීම දෙමළ කොංග්‍රසයට හිතකර විය. ජාතික නායකත්වයට අභියෝග කිරීමට රැඩිකල්වාදී සිංහල නායකත්වය එළි දකින විට එය සිංහල පමණක් යන වේදිකාවක විය. සමහර විට දෙමළ නායකත්වය එහි මුල් ජාතික භාෂා න්‍යායට පවත්වාගෙන ගියේ නම් රැඩිකල්වාදී බහු වාර්ගික

සංවිධානයන් මගින් සිංහල-දෙමළ ද්විභාෂා වේදිකාවක අභියෝගය ඉදිරිපත් කිරීමට ඉඩ තිබුණි. එසේ වූයේ නම් පනස් ගණන්වල මැද භාගයේ ආරම්භ වූ සමාජ, සංස්කෘතික හා දේශපාලන පරිණාමය බෙදුම්කාරී නොව ඒකාබද්ධකාරී වීමට ඉඩ තිබුණු අතර දෙමළ කතා කරන්නන් ආන්තිකකරණයට සහ බැහැරකිරීමට භාජනය කොට සිංහල කතා කරන්නන්ට පමණක් වාසි සැලසීම නොව භාෂා කණ්ඩායම් දෙකටම ප්‍රයෝජනවත් වීමට තිබුණි.
නිදහස ලැබීම තෙක්ම දෙමළ නායකත්වය නියම ලෙස, ඒකමතිකව සහ දැඩි ලෙසම එක්සත් ශ්‍රී ලාංකික රාජ්‍යයක් කෙරේ කැමැත්ත දැක්වූහ. ෆැඩිය ක්‍රමය පිළිබඳ සංකල්පය ප්‍රථමවරට හඳුන්වා දෙන ලද්දේ නිදහසෙන් පසුව පමණක් වන අතර 1952 මහ මැතිවරණයේදී එය යාපනයේ පවා පැහැදිලිවම ප්‍රතික්ෂේප කරන ලදී. ශ්‍රී ලාංකික දෙමළ ජනතාව ෆැඩිය ක්‍රමයකට යොමු වූයේ 1956 සිංහල පමණක්ය යන ව්‍යාපාරයත් සමඟයි. කල්යාමේදී මෙම ජාතික වාදය විසින් වෙන්වීමේ අංගයක් අන්තර ගනු ලැබූ නමුත් එය 70 ගණන්වල මැද භාගය වන තුරුම පසෙකටවී පැවතුණි. වෙන්වීමක් ගැන කතා කළ සෑම ඡන්ද අපේක්ෂකයෙක්ම සෑම පාර්ලිමේන්තු මන්ත්‍රී ආසනයක් සඳහා පැවති මැතිවරණයකදීම අන්ත පරාජයට පත්විය. 1975 පෙබරවාරියේ පැවති අතුරු මැතිවරණයේදී කන්කසන්තුරේ ජයගෙන එස්.ජේ.වී. චෙල්වනායගම් පැවැත්වූ ප්‍රකාශය ගමන් මගේ දෙවෝපගත වෙනසක් සනිටුහන් කරයි.

> ඒකාබද්ධ ලංකාවක් තුළ සිංහල ජනයා සමඟ සමානාත්මතාවය පිළිබඳ පදනම මත අපේ දේශපාලන අයිතිවාසිකම් තහවුරුකර ගැනීමට පසුගිය අවුරුදු 25 ඇතුළත අපි සෑම උත්සාහයක්ම දරා ඇත්තෙමු.. දිගටම පැවැති සිංහල ආණ්ඩු නිදහස ලැබීම තුළින් ගලා එන බලය පාවිච්චිකර ඇත්තේ අපට අපේ නන්වැදෑරුම් මූලික නිදහස අහිමිකොට අප යටත් ජනතාවක් ලෙස පහත හෙළීමටයි..... මේ මැතිවරණයේ දී ඇති තීරණය, මේ වන විටත් දෙමළ ජනතාව වෙත භාරවී ඇති ස්වෛර භාවය පාවිච්චිකර නිදහස් වීමට දෙමළ ඊලාම් ජාතිය සඳහා දී ඇති ජන වරමක් බව මගේ ජනතාවටත් රටටත් ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙමි.

එම ප්‍රකාශය සහ වෙන්වී යාමට කැමැත්ත දක්වමින් 1976 වඩුක්කොඩෙයි යෝජනාව දෙස බැලිය යුත්තේ විශ්ව විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී "ප්‍රමිතිකරණය" සඳහා වූ පටිපාටියක් අනුමත කිරීම සහ 1972 ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව ඇතුළුව ඇති වූ නොයෙකුත් වේදනාකාරී අවාසනාවන්ත සිද්ධි අනුසාරයෙනි. 1971 දී විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම් "ප්‍රමිතිකරණය" අනුමත කළ පසුබිම දෙස බලන විට එය දේශපාලන වශයෙන් කිරීමට බල කෙරුණු කාරණයක් වශයෙන් සිංහල නායකයන් බොහෝ දෙනෙක් දකින්නට ඇත. එය ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව තුළ බිහි කරන්නට ඇති වේදනාකාරී ඝට්ටනය තේරුම් ගැනීමට ඔවුහු අපොහොසත් වූහ. (නොඑසේ නම් ඔවුහු ඒවාට සැලකිලිමත් නොවූහ). අනික් අතට විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම්වලදී වර්ධනය වෙමින් තිබූ අසමතුලිත තත්ත්වය නිසා සිංහල නායකයන් කෙරෙහි තිබූ දේශපාලන බලපෑම් තේරුම් ගැනීමට ශ්‍රී ලාංකික දෙමළ නායකයෝ අපොහොසත් වූහ. (නොඑසේ නම් ඔවුහු ඒ ගැන සැලකිලිමත් නොවූහ). මේ කාරණය ගැන විවිධ ජනවාර්ගික කණ්ඩායම්වල දේශපාලන නායකයන් සාකච්ඡා පැවැත්වූයේ නම් පිළිගත හැකි විසඳුමක් කරා යාමට ඉඩ තිබුණි. එහෙත් එවැනි සංවාද ශ්‍රී ලංකාවේ දේශපාලන සම්ප්‍රදායයේ කොටසක් නොවේ. එසේම, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම ද සුළුතර කොටස් විශේෂයෙන්ම ශ්‍රී ලාංකික දෙමළ ජනයා විසින් පුළුල් අන්දමින් දකින ලද්දේ සුළුතර කොටස්වලට වැඩි සැලකිල්ලක් නොදක්වා සිංහල නායකයන් විසින් සිදුකරන ලද ක්‍රියාවක් බවයි. 1976 වඩුක්කොඩෙයි යෝජනාව ඇතිවීමට බල පෑ ප්‍රධාන හේතුවක් වූයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සකස් කිරීමේදී දෙමළ නායකයන් සම්බන්ධ කර ගැනීමට සහ ඔවුන්ගේ අදහස් විමසීමට වත් කිසිදු උත්සාහයක් නොතිබීම නිසා ඇති වූ දෙමළ නායකයන් (සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙමළ ජනයා) කොන් කිරීමයි. ඒ අවස්ථාවේ දී පවා ද එම යෝජනාව සඳහා ඡන්දය දුන් බොහෝ දෙනෙක් සහ ප්‍රසිද්ධියේ එය එරෙහිවීමෙන් වැළකී සිටි බොහෝ දෙනෙක් විසින් එය දකින ලද්දේ යථාපත් කිරීමට විරුද්ධව කෙරෙන නැගී සිටීමක් හෝ උපායශීලී කේවල් කිරීමක් වශයෙන් මිස ඔවුන්ගේ බලාපොරොත්තු ප්‍රකාශ කිරීමක් වශයෙන් නොවේ. එහෙත් එම යෝජනාවේ ඝට්ටනය ඔවුන් විසින් වරදවා තේරුම් කරන ලදී. එක් අතකින්, එම රැස්වීමේ සිටි තරුණ ජනයා එය ඉතා ඕනෑකමින් භාරගත් අතර දශකයක් තුළ සිවිල් යුද්ධයක් බවට වර්ධනය වූ වෙන්වීමේ අරගලයක් ආරම්භ කළහ. අනික් අතට, 1977, 1979 සහ 1983 දී දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වය සහ 1981 දී දෙමළ විරෝධී ප්‍රචණ්ඩත්වය සහ 1983 දී දිවයින ව්‍යාප්ත සංවිධානාත්මක ඝාතන රැල්ල සංවිධානය කළ සිංහල නායකයන්ට එය හොඳ ආයුධයක් ලබා දුන්නාය.

බලයේ සිටි පක්ෂයේ කොටසක් පැහැදිලි ලෙසම සම්බන්ධ වූ 1983 සංවිධානාත්මක ඝාතන රැල්ල එක්කම වෙනවියාම අත්හරින බවට හිඟා දෙන ආකාරයේ ප්‍රකාශයක් කිරීමෙන් වැළකීම නිසා දෙමළ නායකයන් පාර්ලිමේන්තුවෙන් නෙරපා හැරීම මගින් දෙමළ ජනයා සක්‍රිය අන්දමින් පාලන තන්ත්‍රයෙන් ඉවත් කරන ලදී. මේ නිසා ලාංකික දෙමළ ජනයා අතර වූ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියේ පුළුල් කැඩීමක් ඇති වීම නිසා ඇති වූ හිදැස වැලැක්විය නොහැකි පරිදි සන්නද්ධ කණ්ඩායම් විසින් පුරවනු ලැබිය.

90 ගණන්වල ලක්ෂණයක් වූයේ නැගෙනහිර ප්‍රදේශයේ ශක්තිමත් අඩිතාලමක් සහිත ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂය බිහිවීම සහ උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල එ.ජා.ප.යට හා ශ්‍රී.ලං.නි.ප යට දෙමළ සහ මුස්ලිම් ජන දෙකොට්ඨාසයේම සහයෝගය පිරිහීමයි. දෙමළ භාෂාමය ජාතිකත්වය මත පදනම් වූ මුල් දේශපාලන ප්‍රාරම්භය දෙමළ කථාකරන ජනවාර්ගික කණ්ඩායම් ඒකාබද්ධ කිරීමට අසමත් වූ අතර උතුරේ සහ නැගෙනහිර දෙමළ සහ මුස්ලිම් ජන කොටස්වල දේශපාලන ප්‍රශ්න මතුකරමින් එම ප්‍රදේශවල දේශපාලන හැනීම් මතුකර දැක්වීමට එම කටයුතු උපකාර වූ වා විය හැකිය. තර්කානුසාර සිද්ධියක් වූයේ නැගෙනහිර පළාතේ ශක්තිමත් පදනමක් සහිත මුස්ලිම් දේශපාලන පක්ෂයක් (ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය) බිහිවීමයි. මුස්ලිම්වරුන්ගේ පැත්තෙන් බලන විට නැගෙනහිර පදනම්කරගෙන මුස්ලිම් දේශපාලන පක්ෂයක් බිහිවීම උභතෝකෝටික ප්‍රශ්නයක් ඇති කරයි. උතුරු නැගෙනහිර සිටින මුස්ලිම්වරුන්ගේ මේ දක්වා අමතක කර තිබූ දේශපාලන ප්‍රශ්න (ඇතැම් ප්‍රශ්න එම ප්‍රදේශයේ දෙමළ ජනයාගේ ප්‍රශ්නවලට සමාන විවාය) අනිකුත් ප්‍රදේශවල සිටින මුස්ලිම් ජනයා කෙරෙහි අසුබදායක අන්දමින් බලපෑමක් ඇති නොකර ඵලදායි අන්දමින් ඉදිරිපත් කළ හැක්කේ කෙසේද? තවත් ප්‍රශ්නයක් වූයේ උතුරු නැගෙනහිර දෙමළ සහ මුස්ලිම් ජනතාවන්ගේ අපේක්ෂා ගැලපීමයි. සාම ක්‍රියාවලිය සහ ඊට සම්බන්ධ ආතති තත්ත්වයන් මගින් මෙම කරුණු කැපී පෙනෙන තත්ත්වයට පත්වී තිබේ.

කෙටි කාලයක් තුළ හැරුණු විට ශ්‍රී ලාංකික දෙමළ ජනයාට කේන්ද්‍රීය වශයෙන් හෝ පළාත් මට්ටමේ පවා සක්‍රිය දේශපාලන හඬක් කිසිදාක තිබුණේ නැත. උතුරු නැගෙනහිර හැරුණු විට සියළුම දේශපාලන මට්ටම්වල දී ඔවුනු පැහැදිලි ලෙසට කොන් කරනු ලැබූහ. කොළඹ වැනි ශ්‍රී ලාංකික දෙමළ ජනයා වැඩි වශයෙන් ගොනුවී සිටින ප්‍රදේශවල දී පවා දේශපාලන මැතිවරණ තරග

කළ පිත බඳනා තේරී පත්වූයේ කලාතුරකිනි. සිංහලයන් විසින් ආධිපත්‍යය දැරූ දේශපාලන පක්ෂ දෙක විසින් ගෙනගිය (බොහෝ විට අවාසිදායක) දේශපාලන වැඩ සටහන්වලට ඔවුන් (ඉතා නිශේධක අන්දමින්) මේ දක්වා ප්‍රතිචාරය දක්වා ඇත. ඔවුන්ගේ අවශ්‍යතා ගැන සැලකිල්ලක් වූ බවක් දක්නට ලැබුණු දුර්ලභ අවස්ථාවල දී පවා ඇතිකර ගන්නා ලද ගිවිසුම්, ඒවාට එකඟ වූ ආණ්ඩු විසින් එක්කෝ ඒවා කඩ කරන ලදී, නොඑසේනම් උදාසීනත්වයෙන් ක්‍රියාත්මක නොකරන ලදී. ඵලදායී අන්දමින් බලය බෙදා ගනිමින් සියලු මට්ටම්වල දී රාජ්‍යකරණයට සම්බන්ධවීමට ශ්‍රී ලාංකික දෙමළ ජනතාවට අවශ්‍ය ය.

## අනන්‍යතාවය, ස්වයං-නිර්ණය සහ රට සම්බන්ධ මානව අයිතිවාසිකම් පිළිබඳ වාද විෂයයන්

ප්‍රසිද්ධ නොකළ ලියවිල්ලක ගොඩ්ෆ්‍රි ගුණතිලක විසින් දක්වා ඇති පරිදි සිංහල ජාතිකවාදය අතීතයෙන් බිහිවී ඇති අතර, දෙමළ ජාතිකවාදය වර්තමානයෙන් බිහිවී ඇත. එහෙත් ශ්‍රී ලාංකික දෙමළ ජාතිකවාදය මෑතකදී බිහි වීම නිසා එය අල්පකාලීන යයි අදහස් නොකෙරේ. ඉතිහාසය ආපසු හැරවිය නොහැක, නිදහසෙන් පසු ඇති වූ වේදනාකාරී සිද්ධි වැල මකාලිය නොහැකි අතර එවැනි කතාරංගකින් මතුවී ඇති ජාතිකවාදය ආපසු හැරවිය නොහැක. මෙම ජාතිකවාදය, 1995 ජුලි සහ අගෝස්තුවලදී තිම්පු සාකච්ඡාවලදී දෙමළ කණ්ඩායම් විසින් ඒකාබද්ධ ලෙස ඉදිරිපත් කරන ලද, "තිම්පු මූලධර්ම" අනුව අර්ථකථනය කර තිබේ. මෙම තත්ත්වය මතුපිටින් බලන විට වෙන්වීමට සූදානමක් ලෙස පෙනී යාමට පුළුවන, එහෙත් නිජබිම සහ ස්වයං-නිර්ණය යන සංකල්ප (ඒකීය නොවූව ද) එක්සත් ශ්‍රී ලංකාවක් සමග ගැලපෙයි. තිම්පු මූලධර්ම ඉදිරිපත් කරන විවිධ අය ඒවාට විවිධ අර්ථකථන දක්වති. එහෙත් එහි වැදගත්කම වන්නේ එය වෙන්වීම මත පදනම් නොවූ ශ්‍රී ලාංකික දෙමළ ඒකාබද්ධ සැකසුමක් වීමත්, ඒ අනුව එය සාකච්ඡා ක්‍රියාවලියට සම්ප්‍රාප්ත වීමේ ස්ථානයක් ලෙස ප්‍රයෝජනවත් විය හැකි වීමත් ය.

ඉකුත් දශක එක තුළ ඇති වූ සිද්ධි අනුව බලන විට ස්වයං-නිර්ණයට අයිතිවාසිකම් දෙමළ ජාතිකවාදයේ අවශ්‍ය අංගයක් ලෙස මතුවී තිබේ. වෙන්වීමට සහයෝගය දක්වන බොහෝ අය සහ ඊට විරුද්ධ බොහෝ අය තුළ ඇති වැරදි

අවබෝධයක් වන්නේ ස්වයං-නිර්ණය පිළිබඳ අයිතිය වෙන්වියාම පිළිබඳ අයිතිය සමග සම්බන්ධ කොට හඳුනා ගැනීමයි. එසේ නොව හර්ගිස් Jr. (1994) පෙන්වා දෙන පරිදි ස්වයං-නිර්ණයේ විවිධ පැතිකඩවලට මේවා ඇතුළත් වේ:

. . . . .

6. සහයන්ධියන ඇතුළත ස්වාධිකාර ප්‍රදේශ ආකාරයට, භෞමික වශයෙන් හෝ පොදු ජනවාර්ගික, ආගමික සහ භාෂාමය බැඳීම් සහිත කණ්ඩායම්වලට, වෙන්වීමකට අඩු සීමිත ස්වාධිකාරයක් සඳහා අයිතිය;

7. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ගිවිසුමේ 27 වන ව්‍යවස්ථාවේ සහ ජාතික හෝ ජනවාර්ගික, ආගමික සහ භාෂාමය සුළුතර කොටස්වලට අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව මහා සභාවේ 1992 ප්‍රකාශනයේ පිළිගෙන ඇති පරිදි වඩා විශාල දේශපාලන පාලන අධිකාරියක් ඇතුළත සිටින සුළුතර කොටස්වලට ඇති අයිතිවාසිකම්.
. . . . . . . අන්තර්ජාතික නීතියට අනුව වෙන්වීමට අයිතිය එක් විකල්පයක් පමණි. එම විකල්පය වුව ද ඒක පාර්ශ්විකව ක්‍රියාත්මක කිරීමට නොපුළුවන. කැනඩාවේ පාලක මණ්ඩලයේ ආණ්ඩුකාරවරයා විසින් මෙම ප්‍රශ්නය (1998) ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළේය:

. . . . . . ක්වෙබෙක් රාජ්‍යයේ ජාතික සභාවට, ව්‍යවස්ථාදායකයට හෝ රජයට ක්වෙබෙක් කැනඩාවෙන් ඒක පාක්ෂිකව වෙන්වීම ක්‍රියාත්මක කිරීමේ අයිතිය දෙන්නාවූ ස්වයං-නිර්ණ අයිතිවාසිකමක් අන්තර්ජාතික නීතිය අනුව තිබේද?...

ප්‍රතිචාර වශයෙන් කැනඩාවේ ශ්‍රේෂ්ඨාධිකරණය (1998) එහි අදහස් පැහැදිලිව ප්‍රකාශ කළාය.

. . . . 126 ජනතාවකගේ ස්වයං-නිර්ණ අයිතිවාසිකම සාමාන්‍ය වශයෙන් අත්කර ගනු ලබන්නේ අභ්‍යන්තර ස්වයං-නිර්ණය එනම් පවතින්නාවූ රාජ්‍යය රාමුවක් තුළ ජනතාවකගේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය අත්කර ගැනීම මගින් බව පිළිගත් අන්තර්ජාතික නීතිය විසින් ස්ථාපිත කර තිබේ. ස්වයං-නිර්ණයක් සඳහා වන අයිතිවාසිකම (මේ අවස්ථාවේදී විය හැකි පරිදි ඒකපාක්ෂිකව වෙන්වීමට අයිතිවාසිකමක්

ලබාගැනීමේ ස්වරූපය ගන්නාවූ අයිතිවාසිකම්) ඇතිවන්නේ ඉතාමත් අන්තයටම ගිය අවස්ථාවල පමණි, එයද ප්‍රවේශමෙන් නිශ්චය කරන ලද තත්ත්වයන් යටතේ වෙයි...

127. ස්වයං-නිර්ණය පිළිබඳ අන්තර්ජාතික නීතිය පරිනාමය වී ඇත්තේ පවත්නාවූ රාජ්‍යවල භෞමික අඛණ්ඩතාවයට ගරු කිරීමේ රාමුවක් තුළය. . . . .

130. . . . . සැනසීමට ඇතුළුව, දැනට පවතින්නාවූ රාජ්‍යවල භෞමික අඛණ්ඩතාවය පවත්වාගෙන යාම් සහ සම්පූර්ණ ලෙස ස්වයං-නිර්ණ තත්ත්වය ලබාගැනීමට "ජනතාවකට" ඇති අයිතිවාසිකම අතර අවශ්‍යයෙන්ම නොගැලපීමක් නොමැත. සමානාත්මතාවය පවතින්නාවූ සහ වෙනස්කම්වලට භාජනය කිරීම් නොමැත්තාවූ පදනමක් මත තම මුළු ජනතාවම හෝ තම රාජ්‍ය ප්‍රදේශය තුළ පදිංචි ජනතාව නියෝජනය කරන්නාවූ ආණ්ඩුවක් ඇති එමෙන්ම තම අභ්‍යන්තර විධිවිධානවලදී ස්වයං-නිර්ණය පිළිබඳ මූලධර්මවලට ගරු කරන්නාවූ රාජ්‍යයකට තම භෞමික අඛණ්ඩතාවය රැකගැනීමට අන්තර්ජාතික නීතිය යටතේ හිමිකම තිබේ.

134..... . අභ්‍යන්තර වශයෙන් ස්වයං-නිර්ණයට ජනතාවකට ඇති අයිතිය තේරුමක් ඇති පරිදි පාවිච්චි කිරීමෙන් ඔවුන් අහුරනු ලැබූ විට ස්වයං-නිර්ණ අයිතිය තුළින් ඒකපාක්ෂිකව වෙන්වීමේ අයිතිවාසිකම ඇතිවීමට ඉඩ ඇතැයි විචාරකයන් ගණනාවක් විසින් තවදුරටත් සඳහන් කර තිබේ.. එවැනි වූ පූර්ණ අහුරාලීමක් නිසා වෙන්වීමේ අයිතිවාසිකමට හිමිකම් ඇතිවීමට ඉඩ ඇති බවට දක්වන තර්කයට වියානා ප්‍රකාශනය මගින් පිළිගැනීමක් ලබා දෙයි.

කැනේඩියානු ශ්‍රේෂ්ඨාධිකරණය සහ මෙම විෂය සම්බන්ධයෙන් ලියා ඇති බොහෝ දේ (නිදසුනක් වශයෙන් ස්ටිනර් සහ ඇල්ස්ටන්, 2000) අභ්‍යන්තර සහ බාහිර වශයෙන් වන ස්වයං-නිර්ණය අතර පැහැදිලි වෙනසක් පෙන්වා දෙයි. අභ්‍යන්තර වශයෙන් ස්වයං-නිර්ණය සඳහා විධිමත් විධිවිධාන (නිදසුනක් වශයෙන් වෙනස්කම්වලට භාජනය නොකිරීම හා සම්බන්ධ සමූහාණ්ඩු ක්‍රමයක්) තුළින් ඒක්පාක්ෂික ව වෙන්වීම සඳහා ඇති ඉඩකඩ ඉතා දුරස්ථ වනවා පමණක් නොව එවැන්නක් පිහිට පැතීම ද නීතිවිරෝධී කරයි. අනික් අතට, හිමිකමක් ඇති අභ්‍යන්තර ස්වයං-නිර්ණය තුළින් වෙන්වියාමේ අයිතිවාසිකම නීත්‍යානුකූල වීමට පුළුවන. දේශපාලන ක්‍රියාකාරීත්වයේ දී වැඩි වැඩියෙන් ජනවාර්ගිකත්වය එතුළට රිංගා තිබුනා

වුව ද නැගෙනහිර පළාත එහි පවත්නා අද්විතීය ඉතිහාසය, සංස්කෘතිය සහ නොවැදගත් වාර්ගික මිශ්‍රණය සමග ශ්‍රී ලංකාවේ සහජීවනය සඳහා වූ ආදර්ශකයක් වීමට ඉඩ තිබුනි. කලාප සහා ආණ්ඩු පිහිටුවීම පිණිස එක් එක් ජනවාර්ගික කණ්ඩායම් අනික් කණ්ඩායම හෝ කණ්ඩායම් දෙක සමග සන්ධාන ඇතිකර ගැනීම ගැන සොයා බැලීම ගැන උනන්දුවීමට ද එපරිදිම අනාගත සහජනට හානි සිදුවීම වැලැක්වීම පිණිස අනෙක් කණ්ඩායම් දෙකෙන් එකක් සමඟ අඩදබර ඇතිකර ගැනීමෙන් වැලකීමට ද ඉඩ තිබුනි. අනික් අතට ජාතික දේශපාලන පක්ෂ ද නැගෙනහිර පළාත පිළිබඳ ඔවුන්ගේ වර්තමාන සහ අනාගත සම්බන්ධතා ගැන සිතා දිවයිනේ කිනම් ප්‍රදේශයක හෝ වර්ගවාදී දේශපාලන කටයුතුවල යෙදීමෙන් වැලකී සිටීමට ද උනන්දුවීමට ඉඩ තිබුනි. ඛේදජනක කරුණක් වන්නේ අධික වූ වර්ග ප්‍රචණ්ඩත්වය සහ ජනවාර්ග යුද්ධ කිරීම විසින් නැගෙනහිර ස්වයං-පාලනයක් සඳහා තිබූ අවස්ථාව වැයි ගොස් එහි බිඳ වැටීම පිළිබඳ ඉඩකඩ වැඩිපි ඇති බවක් පෙනී යාමයි.

උඩරට දෙමළ ජනයා සම්බන්ධයෙන් ගත් කල, ඔවුන් විශාල වශයෙන් පදිංචිව සිටින ප්‍රදේශවල සමාන භාෂා අයිතිවාසිකම් නීත්‍යනුකූල වශයෙන් ඇති බව කීමට ඔවුන්ට පුළුවන. සමහර විට ශ්‍රී ලාංකික දෙමළ ජනයා සහ ඉන්දියානු දෙමළ ප්‍රජාවන් ක්‍රම ක්‍රමයෙන් එකට සම්බන්ධවීමට ඇති ඉඩ ප්‍රස්ථා නිසා (උතුරු නැගෙනහිර හෝ කොළඹ පදිංචි උඩරට දෙමළ පිරිස් සම්බන්ධයෙන් දැනටමත් ආරම්භ වී ඇතැයි සිතිය හැකි ඉඩ ප්‍රස්ථාවක්) තමන් දෙමළ බහුතර ප්‍රදේශයක පදිංචිවීමට කැමති නම් තමන්ට යා හැකි වන්නාවූ ද තමන්ගේ භාෂාව, ආගම, සංස්කෘතිය සහ වෙනත් අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු විය හැකි වන්නාවූ ද කලාප, සහා ආණ්ඩුව වශයෙන් ඔවුන් කාලයාගේ ඇවෑමෙන් උතුරු නැගෙනහිර තමන්ට යාමට හැකි කලාපය ලෙස දකින්ට පුළුවන. උතුරු නැගෙනහිරට පරිභාහිරව පදිංචිව සිටින ශ්‍රී ලාංකික දෙමළ ජනයා දැනටමත් දකින්නේ, ඇති කිරීමට යන කලාපය සහ කලාප ආණ්ඩුව මෙම විධිවිධාන ඇතිව පිහිටුවීමට ඉඩ ඇති ලෙසයි.

සංඝීය ආණ්ඩු සංකල්පයට මූලික කාරණය වන්නේ සමූහයට එක්වන්නාවූ කිසිදු ඒකකයක් තනි එකක් නොවන බවකි. එනම් මිනැම් ඒකකයකට නිදහසේ ප්‍රවේශවීමට සියලු පුරවැසියන්ට හැකි බවයි. යම් කලාපයක ජනවාර්ගික සංකලනය වෙනස්කිරීමට සැලසුම් කළ රාජ්‍ය අනුග්‍රාහක ජනපද

පිහිටුවීමේ කුණ්ඩලට නිත්‍යානුකූලව විරෝධය දැක්වීමේ හේතු තිබීමට හැකි නමුදු ජනවාර්ගිකව අන් අය බැහැර කරන්නාවූ කලාප ඒකාබද්ධ කිරීම ප්‍රායෝගික නොවේ. මේ යථාර්ථය ශ්‍රී ලාංකික දෙමළ ජනතාව විසින් මෙන්ම ශ්‍රී ලංකාවේ අනෙකුත් සියලු කලාප සම්බන්ධයෙන් වෙනත් සියලු ප්‍රජාවන් විසින් ද පිළිගත යුතුය. සිංහල, දෙමළ සහ මුස්ලිම්වරුන් පිළිබඳව බොහෝ සේ ජනවාර්ගික ශුද්ධ කිරීම් සිදුවී තිබේ; මේ කාරණයෙහි ලා, සක්‍රිය ප්‍රතික්‍රියා අවශ්‍යය. පරිපාලනය ඒකීය හෝ සන්ධීය හෝ වේවා සමස්ත දිවයින සියලුම පුරවැසියන්ට සමසේ අයිතිය. දෙමළ බහුතරයක් සහිත ස්වයං පාලන කලාපයක් පිහිටුවීම නිසා වෙන්වීමක් සිදු වෙතැයි ද එම ප්‍රදේශයේ පදිංචි සිංහලයන්ගේ ආරක්ෂාව පිළිබඳව ද සිංහල ජනයා තුළ බිය සැකා ඇතිවීමට ඉඩ තිබේ. දැනටමත් පෙන්වා දී ඇති පරිදි, සංඝීය රාජ්‍ය සංකල්පය සහ කලාපයේ වෙනත් රටවල එය ක්‍රියාත්මක කර ඇති ආකාරය මගින් පෙන්නුම් කරන්නේ සංඝීය ක්‍රමය තුළින් ජනවාර්ගික ගැටුම (ඇතැම් විට ඉවත් කරනු නොලැබුවා වුව ද) අඩුවනු ඇති බවයි. වෙන්වීම සම්බන්ධයෙන් ද වෙනත් තැන්වල අත්දැකීම පෙන්නුම් කරන්නේ අවරෝධනය සහ අධික ලෙස මධ්‍යගත කිරීම (බංග්ලාදේශය හා පකිස්ථානය අතර සිදුවූ පරිදි) පවතින තැන්වල වෙන්වීමට ඇති ඉඩකඩ (ස්විට්සර්ලන්තයේ සහ එක්සත් රාජධානියේ පරිදි) විමධ්‍යගත කාරණය කැමැත්තෙන් පිළිගෙන ඇති අවස්ථාවලට වඩා ප්‍රබල බවයි. කැනඩාව සහ ඉන්දියාව යන දෙරටේම සංඝීය ව්‍යවස්ථා නොවී නම් එවා මීට බොහෝ කාලයකට පෙර කැඩී යාමට ඉඩ තිබුන බවින් බංග්ලා දේශය, එරිට්‍රියාව සහ බොස්නියාව තුළ සමානාත්මය සහ අභ්‍යන්තර ස්වයං-නිර්ණ අයිතිය භුක්ති වින්දේ නම් එවා වෙන්වීම සිදුනොවන්නට ඉඩ තිබුනේ යයි ද තර්ක කළ හැක. කෙසේ වෙතත්, වෙන්වීම පිළිබඳව සහ තමිල් නාඩුව සමග සම්බන්ධකම් ඇති කර ගැනීම පිළිබඳව සිංහල ජනයා තුළ පවත්නා බිය සැක දුරු කිරීම ඓතිහාසික නිදර්ශන ප්‍රමාණවත් නොවිය හැක. එබැවින් මේවා ගැන සලකා බලා අවශ්‍ය සුරක්ෂිත භාවයන් සකස්කළ යුතුය. අනික් අතට, කලාප ආණ්ඩු විසුරුවා හැර සෘජු මධ්‍යම පාලනය ඇති කිරීමට මධ්‍යම ආණ්ඩුවට අවහිරයකින් තොරව බලය ලබා දීම සම්බන්ධයෙන් සුළුතර කොටස් තුළ පවතින බිය සැක ගැන ද සලකා බලා කටයුතු කිරීම අවශ්‍ය වෙයි.

“අධික ප්‍රමාණයේ බලය බෙදාහැරීමක් හෝ සංඝීය ක්‍රමයක් ඇති කිරීමක් ....ගැන 1938 දී ලෙනාඩ් වුල්ෆ් තර්ක කළේය. ලෙනාඩ් වුල්ෆ්ට දූරදර්ශී භාවය තිබූ නමුදු, සමානාත්මය, ජනවාර්ගික බහුවිධතාවය සහ බලය

බෙදාගැනීම මත පදනම් වූ බහුවාර්ගික සමාජයක් සඳහා ව්‍යවස්ථාමය අඩිතාලම් දැමීම ට ශ්‍රී ලංකාව අපොහොසත්වීම තුළින් ජනවාර්ගික ගැටුම වර්ධනය වී තිබේ."(තිරුචෙල්වම්, 1997:33) ඕනෑම රාජ්‍යයකට පැවැත්මක් ඇතිවීමට නම් එට නීත්‍යානුකූල භාවයක් පවතින බව එහි ජනතාවගේ සියලු ප්‍රධාන කොටස්වලට පෙනී යා යුතුය. මෙය හැකි වන්නේ එවැනි සෑම කොටසකටම ආණ්ඩුව පිහිටුවීමේදී සහ රාජ්‍ය පාලනයේ සෑම මට්ටමක දී හඬක් නැගීමට හැකි නම් පමණි. ආණ්ඩුව පිහිටුවීමේදී හා රාජ්‍ය පරිපාලනයේදී මධ්‍යම මට්ටම තුළ සුළුතර ප්‍රජාවක් විසින් විශාල හඬක් නැගීම සහතික කිරීම අසීරු විය හැක. එහෙත් පළාත් මට්ටමට ප්‍රමාණවත් ලෙස බලතල විමධ්‍යගත කිරීම තුළින් ශ්‍රී ලාංකික දෙමළ සහ මුස්ලිම් ජනතාවන්ට මේ දක්වා භුක්ති විද නොමැති අභ්‍යන්තර ස්වයං නිර්ණ අයිතිය භුක්ති විදීමට ඉඩකඩ සැලසිය හැක.

## භෞමිකව අභ්‍යන්තර ස්වයං නිර්ණය කරා ගමන් කිරීම

දැන් ඉන්දියාව, පකිස්තානය සහ බංග්ලාදේශය වශයෙන් ඇති ප්‍රදේශ බොහොමයක් ශත වර්ෂයකට අධික කාලයක් තුළ නිතර ඇතිවන ජනවාර්ගික, ආගමික හා කුල ගැටුම් නිසා ව්‍යසනයට පත්ව ඇත. සංසන්දනාත්මකව බලන කළ 1915 ඇති වූ මුස්ලිම් විරෝධී කෝලාහල පිළිබඳ කෙටි කාල සීමාව හැරුණු විට, ශ්‍රී ලංකාවේ අපි පනස් ගණන් වන තෙක් එම ප්‍රදේශවල පැවති ප්‍රමාණයේ හෝ අධික තත්ත්වයේ ගැටුම්වලට මුණ දී තිබුණේ නැත. 1956 සහ 1958 දෙමළ-විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා දරුණු කම්පනයක් ඇති කළ අතර 1977, 1979 සහ 1981 පැවති එවැනි ක්‍රියා 1983 ඝාතනවලට සහ ඒ සමග ඇතිවූ සිවිල් යුද්ධයට මඟ පෑදුවේය.

සම් සුළු අඩුවැඩිවීම් හැරුණු විට අඩු තරමින් පසුගිය දශක හය තුළවත් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අන්තර්සම්බන්ධතාවල සමස්ත නැඹුරුව නිශේධක තත්ත්වයේ පැවත ඇත. විශේෂයෙන්ම, දශක පහකට පෙරාතු කාලය පෙන් ඒකීය ශ්‍රී ලංකාවක් සමග සතුටින් සිටි ශ්‍රී ලාංකික දෙමළ ජනයා ස්වයං පාලන උතුරු නැගෙනහිර ප්‍රදේශයක් හරහා එක වරම අභ්‍යන්තර ස්වයං-පාලනය ඉල්වූ හ. තවත් දශක දෙකක් තිස්සේ ඔවුහු වෙන්වීමට ඉතා දැඩි ලෙස හා නිරන්තරයෙන්ම විරුද්ධ වූහ. එහෙත් හැත්තෑ ගණන්වල දී බාහිර ස්වයං-

නිර්ණය (වෙන්වීම) සඳහා වූ දැඩි ඉල්ලීමක් මතුවිය. දශක දෙකක පමණ කාලයක සිවිල් යුද්ධයකට පසුව, දශක පහකට පෙරාතුව ශ්‍රී ලාංකික දෙමළ නායකත්වය විසින් යෝජනා කොට එවකට සිංහල නායකත්වයේ සියලු අංශ විසින් ඉතා දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන ලද අභ්‍යන්තර ස්වයං නිර්ණය පදනම්වූ ජාතික විසඳුමක් ඇති විය හැකි බව පෙනෙන්ට තිබේ.

පසුගිය දශක හය තුළ ඇති වූ ගැටුම් පමණක් සලකා අභ්‍යන්තර ස්වයං නිර්ණය මත පදනම් වූ විසඳුමක අවශ්‍යතාවය ඇති වී තිබේ ද යන සහ එවැනි ප්‍රවේශයක් නොවැලැක්විය හැකිව තිබුණේ ද යන ප්‍රශ්නය පැන නගී. දේශපාලන සංවිධානයේ සහ රාජ්‍ය පාලනයේ ජනවාර්ගික භාවය ඉස්මතුවීම විශ්වීය වශයෙන් කැපී පෙනෙන ලෙස වැඩිවීමත් එය ලොව පුරා ගැටුම්වල නිමිත්තක් වීමත් දෙස බලන විට, ශ්‍රී ලාංකික තත්ත්වය පිළිබඳව පෙනී යන්නේ අභ්‍යන්තරික වශයෙන් ස්වයං නිර්ණයට ඉඩ නොසලසන කිනම් ක්‍රමයක් වුව ද පැවතීමට ඉඩකඩ නොතිබුණ බවයි. භෞමික ස්වයං නිර්ණය සහ භෞමික නොවන ස්වයං - නිර්ණය යන දෙක අතර තෝරා ගැනීම පිළිබඳ තවත් ප්‍රශ්නයක් එවිට මතු වෙයි. එනම් භාෂා සංවේදී භෞමික ස්වයං පාලනය (නිදසුනක් වශයෙන් කැනඩාවේ සහ ඉන්දියාවේ පරිදි) සහ දේශපාලන ක්‍රියාවලිය තුළ සහ රාජ්‍ය පාලනය තුළ භෞමික නොවන්නාවූ ජනවාර්ගික නියෝජනයක් (නිදසුනක් වශයෙන් මලයාසියාවේ පරිදි) වශයෙනි.

භූමිය මත පදනම් වන්නාවූ අභ්‍යන්තර ස්වයං නිර්ණය තුළින් රාජ්‍ය පාලනය වෙනික නොවීමට ඉඩ තිබෙන බව අවබෝධකර ගැනීම මෙහිදී අදාළ වේ. පරිපාලනය පිළිබඳ භාෂාව ගැලපුණු විට එක් ස්වයං පාලන ඒකකයක නීති සහ දේශපාලන ක්‍රියාදාමය අනික් ඒවායේ තත්ත්වයන්ට වඩා වෙනස්වීමට අවශ්‍ය නැති අතර අයිතිවාසිකම් සහ අවස්ථාවන් ද ජනවාර්ගිකත්වය අනුව නිර්වචනය කිරීමට අවශ්‍ය නැත. එවැනි තත්ත්වයක් තුළ ජනවාර්ගික හැඟීම් පිළිබඳ ක්‍රමික අඩුවීමක් සිදුවීම නොවැලැක්විය හැකි දෙයක් නොවුව ද එවැනි අඩුවීමට ඉඩ තිබේ. අනික් අතට ස්වයං නිර්ණය භූමිය මත පදනම්ව නැත්නම් නීති සහ රෙගුලාසි තුළ, ආයතන තුළ සහ දේශපාලන ක්‍රම තුළ ජනවාර්ගික හැඟීම් පැවතීම සහතික කරමින් ඒවා තුළ පැහැදිලි ලෙස ජනවාර්ගිකත්වය පිළිබිඹු කළ යුතු වේ. මැලේසියාවේ තත්ත්වය එසේ ය. එහි දේශපාලන සංවිධානය ජනවාර්ගික භාවය මත පදනම්වී තිබෙන අතර,

බලයේ සිටින පක්ෂය සහ විපක්ෂය යන දෙකම අන්තර්-වාර්ගික සභාගයන්ය. භූමිපුත්‍ර ප්‍රතිපත්ති මගින් අයිතිවාසිකම් සහ අවස්ථා ජනවාර්ගික තත්ත්වයන් අනුව තීරණය කරනු ලබයි. ඉන්දියාවට තුළ ප්‍රාන්ත රාජ්‍යයන්හි භාෂාමය ප්‍රතිසංවිධානය මගින් භාෂාමය ජාතිකත්වය බොහෝ සේ නිෂ්ක්‍රියකර ඇති අතර සංගමයේ ප්‍රාන්ත රාජ්‍ය ව්‍යවස්ථාදායක යන්හි නියමිත කුල සහ ගෝත්‍ර නියෝජනයට සහ රාජ්‍ය සේවාවලට හා අධ්‍යාපනික ආයතනවලට බඳවා ගැනීම් සඳහා යොදා ඇති විශේෂ විධිවිධාන නිසා කුල සහ ගෝත්‍ර හැඟීම් දිගටම පවතී. මේ අනුව ස්වයං පාලනයට සුදුසු තරම් විශාල වූ ප්‍රදේශවල ඉන්දියාවේ ප්‍රධාන භාෂාමය කණ්ඩායම් ස්ථානගතවීම භාෂාමය ජාතිකත්වය සමනය කිරීමට උපකාර වී ඇති අතර, ඒ හා සසඳන විට දලිත්වරුන් (කුලහීනයන්) සහ ගෝත්‍රික ප්‍රජාවන් ස්වයං පාලනය පිණිස කුඩා වැඩි තැන්වල විසිර සිටීම නිසා ඓතිහාසික විධිවිධාන නොව ව්‍යවස්ථාදායකවල, රාජ්‍ය සේවාවල සහ අධ්‍යාපනික ආයතනවල ඔවුන්ට නියමිත නියෝජනයන් සැලසීමට නිශ්චිත කුල සහ ගෝත්‍රික පංගු සැලසීම අවශ්‍ය වී තිබේ.

මේ අනුසාරයෙන් බලන විට දෙමළ කථාකරන්නන් (හෙවත් දෙමළ සහ මුස්ලිම් ජනයා) උතුරේ සහ නැගෙනහිර රාශිගතව වාසය කිරීම වාසිදායක තත්ත්වයකි; මක් නිසාද යත් භෞමික පදනමක් මත ජෙතික වශයෙන් බලය බෙදාහැරීමක් තුළින් අභ්‍යන්තර ස්වයං නිර්ණයකට එය ඉඩ සලසන හෙයිනි. විකල්පයක් වන්නට තිබුණේ මැලේසියාවේ පරිදි උච්චවූ ජනවාර්ගික හැඟීම දිගටම පැවැත්ම සහතික කරමින් ජනවාර්ගිකත්වය පදනමෙන් විශේෂ විධිවිධාන සැලසීමයි. ස්වයං පාලන ප්‍රදේශ ඒක-ජනවාර්ගික විය යුතු යයි යෝජනා නොකෙරේ-එය භයානක ව්‍යසනයක් වනවා ඇත, හෝ අතීතයේ සිදු වූ ජනවාර්ගික ශුද්ධ කිරීම් නිවරදි නොකළ යුතු යයි ද අදහස් නොකෙරේ. ඇත්ත වශයෙන්ම (උතුර නැගෙනහිර ඇතුළු) සියලුම ස්වයං පාලන කලාප ජනවාර්ගික වශයෙන් විවිධවීම ප්‍රාර්ථනා කටයුතු දෙයකි.

භෞමික අභ්‍යන්තරික ස්වයං-නිර්ණ ක්‍රමයක් ප්‍රාර්ථනා කළ යුතු සහ නොවැලැක්විය හැකි නම් එය නිදහස ලබන අවස්ථාවේ දී හෝ විට පෙරාතුව හෝ ස්ථාපිත නොකළේ මන්ද? පැහැදිලිවම දුරදර්ශී භාවයක් නැතිකම පැවතුනි; එමෙන්ම අන්තර්-වාර්ගික සාකච්ඡා නැතිකම ද තිබිණ. එය අපේ දේශපාලන සංස්කෘතියේ අවාසනාවන්ත අංගයක් විය. විසි

ගණන්වල දී සහ තිස් ගණන්වලදී උඩරට සිංහල ජනයා වැනි භෞමික අභ්‍යන්තරික ස්වයං-නිර්ණ ක්‍රමයක් ගැන සඳහන් කර ඇත; එහෙත් එම ඉල්ලීම් ඉදිරිපත් කර ඇත්තේ උඩරට නිකායවාදී අනුදේශවලට අනුව වන අතර ශ්‍රී ලාංකික දෙමළ ජනයා ඇතුළු අනිකුත් ප්‍රජා කොට්ඨාශ විසින් ඒවාට විරුද්ධත්වය ප්‍රකාශ කර ඇත. නැවතත් පනස් ගණන්වල සහ හැට ගණන්වල භෞමික අභ්‍යන්තර ස්වයං-නිර්ණය ඉදිරිපත් කිරීමට ශ්‍රී ලාංකික දෙමළ ජනයා යොමු කරනු ලැබූ විට ඔවුන් ද සිය ඉල්ලීම් ගොනු කොට තිබුණේ නිකායවාදී අනුදේශ තුළය. ඊට අනික් අයගේ, විශේෂයෙන්ම සිංහල ජනයාගේ, විරෝධය මතුවිය. මාක්ස්වාදී චින්තනය අනුව හතළිස් ගණන්වල ගම් ප්‍රමාණයක භෞමික ස්වයං පාලන ක්‍රමයක් යෝජනා කර තිබූ කොමියුනිස්ට් පක්ෂයට පවා ශ්‍රී ලාංකික දෙමළ ෆෙඩරල්වාදීන් සමඟ එකඟවීමට නොහැකි විය. ඒකීය පාලන ක්‍රමයක් වෙනුවට වෙනත් විකල්පයක් වශයෙන් සංඝීය ක්‍රමය ඉදිරිපත් කිරීම සඳහා බහු-වාර්ගික සභාගයක් ඇතිකිරීමට තිබූ අවස්ථාව මග හැරී ගියේය. සිදු වූ පරිද්දෙන්, ශ්‍රී ලංකාව එකට තබා ගැනීම සඳහා ව්‍යවස්ථාමය විධිවිධානවල අවශ්‍ය අංගයක් ලෙස කලාප ස්වයං පාලනය පිළිගැනීමට අප මෙහෙය වූ දශක පනහකට වැඩි කාලයක් තුළ පැතිර ගිය දේශපාලන ගැටුම් සහ දශක දෙකකට ආසන්න කාලයක සිවිල් යුද්ධයක් සහිත අරමුණක් නැති දීර්ඝ ගමනක් ගොස් ඇත. 2002 දී හොඳ ප්‍රගතියක් ඇතිවිය. සාකච්ඡා පවත්වා ගෙන යයි, එහෙත් සාමය තවමත් සුරක්ෂිත වී නොමැත. ඉදිරියේ එළඹෙන දශකවලදී තවදුරටත් ගැටුම් ගැන ක්‍රියා කිරීම සඳහා සියලුම මට්ටම්වල අන්තර්-වාර්ගික සාකච්ඡා සහ සහයෝගිතාව අවශ්‍ය වේ.

## සියලු දෙනාම සඳහා මානව අයිතිවාසිකම්

මතුපිටින් බලන විට ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම සිංහල බහුතරය සහ සුළුතර කොටස්, විශේෂයෙන් දෙමළ ජනයා, සමඟ පවතින්නක් බවත් සිංහල කතා කරන බහුතරය සහ දෙමළ කතා කරන සුළුතරය අතර පවතින භාෂාමය භේදයක් බවත් පෙනී යාමට පුළුවන. එහෙත් පින්තූරය මීට වඩා සංකීර්ණ වේ. ආගමික වෙනස සිංහල සහ දෙමළ කථාකරන භාෂාමය ජන වර්ග හරහා ද දිවෙයි. කුලය මත වෙනස්කම් ද එසේමය. මේ සියල්ල අභිබවා පංති පිළිබඳ වෙනස්කම්, එක් අතකින් ජන වාර්ගික භාවය, භාෂාව, ආගම, කුලය ආදිය පදනම් කරගත් කණ්ඩායම් අභ්‍යන්තර වශයෙන් වෙන්කරන අතර අනික් අතට සියලු පංති හරහා දිවෙන සම්බන්ධතා වර්ධනය කරයි.

තවද, ක්‍රමයෙන් පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රදේශ සහ නගර සහ ගම් දක්වා වෙන් කළොත් හෝ පළාතෙන් පළාතට, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ප්‍රදේශයෙන් ප්‍රදේශයට, නගරයෙන් නගරයට හා ගමෙන් ගමට තිරස් ලෙස අපේ අවධානය යොමු කළොත් අපේ ජාතිමය, ආගමික සහ සංස්කෘතික උරුමය පිළිබඳ විවිධ වූ සංවිධාන අපට හමුවෙයි.

උතුරු නැගෙනහිර ඇළ වැඩි කොටසක සහ වෙනත් ප්‍රදේශ සමහරෙක සිංහලයන් සහ බෞද්ධයන් සිටින්නේ සුළුතර කොටස් වශයෙනි. අනික් පළාත්වල ඔවුනු බහුතරය වෙති. එහෙත් එම පළාත්වල පවා ගණනින් ඔවුන් අභිබවන ප්‍රදේශ පවතී. අනික් අතට උතුරු නැගෙනහිර සිංහල ජනයා සහ බෞද්ධ ජනයා බහුතරයක් ලෙස සිටින ප්‍රදේශ කීපයක්ම තිබේ. දෙමළ සහ මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් ද එසේමය. ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් සෑම එකක්ම ප්‍රදේශ කීපයකට බහුතරය වන අතර වෙනත් ප්‍රදේශවල සුළුතරය වෙයි. ගැටුම් මගහැරීමට හෝ සීමාකිරීමට හැකි වුවොත්, රැස්වීම, අවබෝධය, සහ මිත්‍රශීලී අන්තර් වාර්ගික සම්බන්ධතා පැවැත්වීමට මේ තත්ත්වය උපකාරී විය හැක. එක් ජනවාර්ගික කණ්ඩායමක අය තවත් දිවයිනේ තැනක ආපදාවලට ගොදුරු විය හැකි සුළුතර කොටසක් බව දැන ගැනීමෙන් ජනවාර්ගික කණ්ඩායමක් විසින් බහුතරවාදී බලය පාවිච්චි කිරීම මැඩලීමට උදව්විය හැක. අනික් අතට එක් ප්‍රදේශයක ප්‍රචණ්ඩ අන්තර්-වාර්ගික ගැටුමක් තවත් ප්‍රදේශයක එකට එක කිරීමේ තත්ත්වයක් ඇති කිරීමට පුළුවන.

සුළුතර කොටස්වල අත්දැකීම් ප්‍රදේශයෙන් ප්‍රදේශයට ද කාලයෙන් කාලයට ද වෙනස් වෙයි. සුළුතර කොටස් තුළ පවතින සමහර බිය සැක, ඔවුන් මුහුණපා හැකි අගතීන් නොමැති වුව ද ඔවුන් මුහුණපාන වෙනස්කම්වලට භාජනය කිරීම් නිශ්චිත අගති හෝ වෙනස්කම් නොමැතිව වුව ද ඔවුන් පෙළිය හැකි අවාසිදායක තත්ත්වයන් සමහරක් ලැයිස්තුගත කිරීම ප්‍රයෝජනවත් විය හැක.

## ශාරීරික අනාරක්ෂාව සහ පහත් කොට සැලකීම

අතිශයින්ම කම්පනයට පත්කරන බිය වූ කලී ශාරීරික වශයෙන් පවතින අනාරක්ෂාවයි. 1915 පැවති මුස්ලිම් විරෝධී කැරලිවලට පසුව දශක හතරකට වැඩි කාලයක් ජාතික වශයෙන් ජනවාර්ගික භාවයට සම්බන්ධ

කැපී පෙනෙන ප්‍රචණ්ඩ ක්‍රියාවලින් ශ්‍රී ලංකාව කැපී පෙනෙන අන්දමින් නිදහස්ව සිටියාය. අවාසනාවකට මෙන් මෙම වාර්තාව (ගාළු මුවදොර සත්‍යාග්‍රහයේ යෙදුන දෙමළ ජනයාට පහර දීමෙන් ආරම්භ කොට) 1956 දී ද, වඩාත් වැඩි ප්‍රමාණයකින් සහ බොහෝ ස්ථානවල ද 1958 දී ද තබන ලදී. දශක දෙකක පමණ නිහඬ කාල පරිච්ඡේදයකින් පසුව ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා 1977 දී නැවතත් ඇති වී 1983 ජන සංහාරයෙන් උච්චස්ථානයකට පැමිණ ඉන්පසු විටින් විට දිගටම පැවතුනි. අවස්ථා කිපයකදීම (නිදසුනක් වශයෙන් දෙමළ ජනයාට එරෙහිව යොමු කළ 1983 ජන සංහාරය) ප්‍රචණ්ඩත්වය සමග ජන වාර්ගික ශුද්ධකිරීම් සිදු කරන ලද්දේ ප්‍රචණ්ඩත්වයක් ඇති කරන බවට තර්ජනය කිරීම තුළිනි. සන්නද්ධ සේනා සටන්කාමී සිංහල, දෙමළ සහ මුස්ලිම් කණ්ඩායම් ජනවාර්ගික ශුද්ධකිරීම්වල යෙදී ඇත. විශේෂයෙන්ම නැගෙනහිර එසේ සිදුවිය. ඊට ගොදුරුවූ අයට සිංහල, දෙළ සහ මුස්ලිම් ජනයා දහස් ගණනක් වූහ. 2002 වර්ෂය තුළ ජාතික වශයෙන් ප්‍රචණ්ඩත්වයේ ප්‍රමාණය අඩුවී ඇත. එහෙත් ඇතැම් ප්‍රදේශවල, විශේෂයෙන්ම නැගෙනහිර ආතතිය වැඩිවී තිබෙන අතර වරින් වර එය ප්‍රචණ්ඩත්වය වශයෙන් මතුවෙයි.

වාර්ගික වශයෙන් වෙනස්කමකට භාජනය කිරීමක් වන්නාවූ සහ පහත් කොට සැලකීමක් වන්නාවූ කාරණයක් නම් කොළඹ සහ වෙනත් ප්‍රදේශවල වෙසෙන දෙමළ ජනයාට සිය පදිංචි ස්ථාන පොලිසිවල ලියාපදිංචි කිරීම සහ තාවකාලික පදිංචිය සහ එක් රැයක් වෙනත් තැනක ගත කරන්නේ නම් එම ස්ථානය පවා නැවත ලියාපදිංචි කිරීමට අවශ්‍ය බවට නියම කිරීමයි. මෙය තුළින් දැඩි අමනාපකමක් වර්ධනය වූ අතර අනාරක්ෂිත භාවය පිළිබඳ හැඟීම් ද ජනිත විය. පරීක්ෂණ පැවැත්වීම මුවාවෙන් රෑ බෝ වූ පසු දෙමළ ගෙවල්වලට යෑම පිණිස ඒවා ඉලක්ක කර ගැනීම සඳහාත් මාර්ග බාධකවලදී කරදර කිරීම සඳහාත් තොරතුරු ලබාගැනීමට මෙම ලියාපදිංචි කිරීම මගින් පොලිසියට හැකි විය. උතුර නැගෙනහිරට පිටත මෙම භාවිත අවසානයකට පැමිණ ඇති බව පෙනී යාම සතුටට කරුණකි, එහෙත් උතුරු නැගෙනහිර බොහෝ ප්‍රදේශවල මෙම ප්‍රශ්නය පවතී. ආරක්ෂක හමුදා සහ ඊට සම්බන්ධ කණ්ඩායම් මගින් ද එල්ටීටීඊය සහ ඊට සම්බන්ධ කණ්ඩායම් මගින් ද සිදු කෙරෙන හිරිහැර කිරීම් පිළිබඳව සිංහල, දෙමළ සහ මුස්ලිම් වැසියෝ පැමිණිලි කරති, පරීක්ෂණ පැවැත්වෙන තැන්වලදී සිදුවන ශාරීරික අනාරක්ෂක භාවය සහ හිරිහැර හැරුණු විට බොහෝ ප්‍රදේශ ජනවාර්ගික වශයෙන් ශුද්ධකොට පවති, ජනවාර්ගික වෙන්කිරීම සාමය සහ ආරක්ෂාව

සඳහා කෙරෙන්නක් බව කීමට හැකි වුව ද, ඇත්ත වශයෙන්ම ජනවර්ග වෙන් කොට තැබීම මගින් අගති බිහි කරන අතර ජනවාර්ගික ශුද්ධකිරීම නිසා අනිවාර්යයෙන්ම එදිරිවාදිකම් සහ අමනාපකම් ඇති වෙයි. සැබෑ පවත්නා සාමයක් හා ආරක්ෂාව සඳහා වෙන්කර තැබීම් කිසිදාක පදනමක් වන්නේ නැත.

## භාෂාව උඩ වෙනස්කම්වලට භාජනයකිරීම සහ ආන්තිකරණය

රාජ්‍ය භාෂාව (භාෂා) පිළිබඳ කාරණය මත 50 ගණනවල දී ප්‍රධාන පෙළේ, දීර්ඝ කාලීන සහ තවමත් නොවිසඳී පවතින අර්බුදයක් ඇති විය. මෙය වූ කලී මලෙයිහා දෙමළ ජනයාගේ පුරවැසි භාවය සහ ඡන්ද අයිතිය නැතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේශපාලන සංකලනයේ ඇති වූ වෙනස්වීමේ තර්කානුසාරී ප්‍රතිඵලයයි. දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් වශයෙන් පිළිගැනීම නිසා නීත්‍යානුකූලව මෙම අර්බුදය ද පහව ගොස් ඇත. එහෙත් යථාර්ථය වන්නේ ඇතැම් අංශ අතින් කිසිදාක තිබුනාටත් වඩා නරක අතට හැරී තිබීමයි. රාජ්‍ය සේවයට බඳවා ගන්නා දෙමළ කථා කරන්නන්ගේ අනුපාතය දශක කාලයක් තිස්සේ පහත වැටෙමින් ඇත. ඔවුන් දැන් සිටින්නේ මුළු සංඛ්‍යාවෙන් 5% වඩා අඩු ප්‍රමාණයකි, වැඩි දෙනා උතුර නැගෙනහිර සේවය කරති. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උතුර නැගෙනහිර දෙමළ කථාකරන මහජනයාට සේවය කිරීම පිණිස ඇති හැකියාව අල්පවී හෝ නැතිවී තිබේ. අනික් අතට උතුරු නැගෙනහිරට යටා ඇති සිංහල කථා කරන රාජ්‍ය සේවකයන්ගේ ප්‍රමාණය පහත වැටී තිබේ. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාගේ රජයේ කාර්යාලයකට හෝ බස් නැවතුම් පලකට ගියොත් මෙම ප්‍රශ්නයේ තරම හෙළිවේ. මිශ්‍ර ජනතාවක් සිටින බොහෝ ප්‍රදේශවල පවා රටේ නීතිරීතිවලට හා ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තියට පටහැනි ලෙස බොහෝ කාර්යාල ඇත්ත වශයෙන්ම පවත්වාගෙන යන්නේ එක් භාෂාවකින් පමණි. භාෂාද්වයෙන් පැවැත්වෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. ප්‍රධාන භාෂාව කථානොකරන අයට මෙම කාර්යාලවල සේවා සක්‍රිය ලෙස අහිමි කෙරේ. නම් සහ නාම පුවරු පවා භාෂා තුනෙන්ම නොවිය හැක, එසේ නැත්නම් රාජ්‍ය භාෂාවලින් එකක් හෝ අනිත නොතිබිය හැක. යථාර්ථයක් වශයෙන් මේ අනුව උතුර නැගෙනහිර ප්‍රදේශයේ සිංහල කථාකරන්නන් අවාසිදායක තත්ත්වයක සිටින අතර, දෙමළ කථා කරන විශාල ජන කොටස් සිටින අනිකුත් පළාත්වල, කොළඹ මෙන්ම අනිකුත් ප්‍රධාන නගර සහ දිස්ත්‍රික්කවල ද, දෙමළ කථාකරන්නෝ අවාසිදායක තත්ත්වයක පසුවෙති.

භාෂා පරිවර්තකයන් සුළු ප්‍රමාණයක් සහ භාෂා ප්‍රවීනතාවය ලබාගැනීමට ඡන්ද වශයෙන් ලබා දී ඇති දිරි ගැන්වීම් මගින් මේ ප්‍රශ්නය ජය ගැනීමට කර ඇති මන්දගාමී උත්සාහයන් බෙහෙවින් අප්‍රමාණවත් බව ඔප්පු වී තිබේ. මේ ප්‍රශ්නය විසඳීමට හැකි ප්‍රමාණයටවත් ගණනය කිරීමට රජයේ නිලධාරීන් බඳවා ගැනීම සහ ඒ ඒ තැන්වලට පත්කර යැවීම සම්බන්ධයෙන් හදිසි සහ මූලික වෙනස්කම් අවශ්‍ය වෙයි. දිගු කාලීනව පාසැල් අධ්‍යාපනය සහ රාජ්‍ය සේවයට ඇතුළත්වීමේ සුදුසුකම් පිළිබඳ අතිරේක සංශෝධන අවශ්‍ය වේ. රාජ්‍ය සේවයට ඇතුළත්වීමට පෙර පාසැල් මට්ටමේදී ත්‍රිභාෂා හැකියාව ලබාගැනීමට පහසුකම් හා දිරිගැන්වීම් ඇතිකිරීම අවශ්‍යය. දැනට දිවයිනේ සෑම කොටසකම ඇති සියලුම කාර්යාලවල අඩුම මට්ටමක හෝ සිංහල සහ දෙමළ භාෂා හැකියාව ඇතිකිරීමට වහාම විධිවිධාන යෙදිය යුතු අතර අඩුතරමින් මිශ්‍ර ජනතාවන් සිටින ප්‍රදේශවලවත් රජයේ කාර්යාල සමග තමන් කැමති භාෂාවකින් තම කටයුතු කර ගැනීමට මහජනයාට පූර්ණ පහසුකම් ප්‍රගාමී ආකාරයට ඇතිකිරීමට අවධිගත වැඩ සටහනක් දියත් කළ යුතුය.

## ජන වාර්ගික විවිධත්වය

ශ්‍රී ලංකාවේ සෑම කොටසකම ප්‍රධාන ජනවාර්ගික ප්‍රවර්ග තුනේ සෑම එකකින්ම අඩුතරමින් කිප දෙනෙක් වත් පදිංචිව සිටීම ප්‍රාර්ථනා කළ යුතු දිගුකාලීන අරමුණකි. 50 ගණන්වල මැද දක්වා එවැනි තත්ත්වයක් අඩුවැඩි වශයෙන් පැවතුනි. ඉන් පසුව 1958 කැරලි කෝලාහල මගින් ඇති කළ ජනවාර්ගික ශුද්ධකිරීමෙන් පසුව දිවයිනේ බොහෝ ප්‍රදේශවල ජනවාර්ගික වශයෙන් මිශ්‍ර වූ වාසික මධ්‍යස්ථාන, අධ්‍යාපනික ආයතන සහ වැඩ බිම්වල අඩුවීමක් සිදුවී තිබේ. 1983 ඝාතන මගින් ප්‍රධාන වෙනසක් සනිටුහන් කළ නමුදු දිවයිනේ බොහෝ ප්‍රදේශවල, විශේෂයෙන් නැගෙනහිර පළාතේ ජනවාර්ගික ශුද්ධකිරීම්වලට ද දායක වූ නොයෙකුත් සිද්ධි රාශියක් තිබුනි. මේ තත්ත්වය නිවැරදි කළ යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අගති දක්නට ඇත්තේ ඉතා සුළුවශයෙන් වීම සතුටට කාරණයකි. එහෙත් අවාසනාවන්තව දිවයින පුරාම තුළ අගතිය පවතී. එය යාපනයේ ඉතා තදින් තිබේ. ජනවාර්ගිකත්වයේ අනිකුත් ලක්ෂණවලට සම්බන්ධ අගති ද තිබේ. අගති හැරුණු විට වෙනස්කම්වලට භාජනය කිරීම් ද තිබිය හැක. නිදසුනක් වශයෙන් අගතියට පත්ව නොමැති ස්වාමියකුට

වුව ද හිතාමතාම හෝ එසේ නොමැතිව හෝ නොයෙකුත් හේතු මත එක් ජනවාර්ගික කණ්ඩායමකින්ම පමණක් සේවකයන් බඳවා ගැනීම හෝ එක් භාෂාවකින් පමණක් කටයුතු කිරීම තමන්ට පහසු බව පෙනී යා හැක. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සුළුතර කොටස්වලට බොහෝ අවාසි සිදුවීමට හැකි අතර එසේ සුළුතර කොටස්වලට අවාසි සිදුවන වග බහුතර ජනවාර්ගික කණ්ඩායමේ අය නොදැන සිටීමට ද පුළුවන. ඒකාන්ත ලෙසට සුළුතර කොටස් තමන් අත් විඳින අවාසි දායක තත්ත්වයන් ගැන හොඳින් දන්නා අතර ඔවුන් තුළ කොන් කිරීමේ හැඟීම් ඇති වෙයි. එක් එක් ප්‍රදේශයේ විවිධ ජනවාර්ගික කණ්ඩායම් තුළ ගැටළුවේ ස්වභාවය සහ ප්‍රමාණය ගැන විවිධ සංජානන තිබීමට පුළුවන.

## කලාපීකරණය

යුද්ධය නිසා ඇතිවී තිබෙන බොහෝ වූ අභාග්‍යසම්පන්න ප්‍රතිඵල අතර ''රජයේ පාලනයට'' අයත් ප්‍රදේශ ''එල්ටීටීඊ පාලනයට අයත්'' ප්‍රදේශ සහ කිනම් ප්‍රදේශයට අයත් ද යන්න ගැන මත භේදයක් ඇති මායිම් ප්‍රදේශ වශයෙන් දිවයින සත්‍ය ලෙස කොටස් තුන තිබීම එක් කාරණයකි. ඇතැම් කාරණා සඳහා-නිදසුන් වශයෙන් ආරක්ෂාව පවත්වාගෙන යෑම, පොලිස් රාජකාරි, නීතිය සහ සාමය රැකීම සහ අධිකරණ ක්‍රියාවලිය-දෙවර්ගය තුළ පවතින ආයතන පද්ධති සහ ඊට සම්බන්ධ රීති සහ රෙගුලාසි එකිනෙකට වෙනස් අතර සම්බන්ධීකරණයක් ද නැත. මේ තත්ත්වය මහජනයා කෙරෙහි ගැටළුම් තත්ත්වයක්, අර්බුදකාරී ස්වභාවයක්, අවිනිශ්චිත භාවයක් සහ වෙනත් නොහැකියාවන් ඇති කරයි. "අපට උවමනා විසඳුමක් ලැබුණු විට සාකච්ඡා මගින් ඇතිකර ගන්නාවූ බේරුම් කිරීම් සමග ක්‍රියාත්මක වන කලාප පොලිස් බල ඇණියට මෙම පොලිස් ස්ථාන ඒකාබද්ධ කළ හැක'' යනුවෙන් 2002 දෙසැම්බර් 5 වෙනිදා ඔස්ලෝහි දී ආචාර්ය ඇන්ටන් බාලසිංහම් විසින් කරන ලද ප්‍රකාශය තුළ මේ අරබයා යම් විශ්වාසය තහවුරු කිරීමක් තිබේ. එල්ටීටීඊ පාලනය යටතේ ඇති ප්‍රදේශවල තිබෙන උසාවි සහ අනිකුත් විශේෂ ආයතන කෙරෙහි ද මෙය අනුගත කරනු ඇතැයි සිතිය හැක.

එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශවල පදිංචි අය අත්විඳින ආරක්ෂාවට සම්බන්ධ නොහැකියාවන්වලට අමතරව ඔවුන්ට රැකියා අවස්ථාවලට, සෞඛ්‍ය ආරක්ෂාව, අධ්‍යාපන ලැබීමට, නිවාස සහ මහජන උපයෝගිතා

වැනි වූ මූලික අවශ්‍යතාවලට ප්‍රවේශවීම අහිමිකර තිබේ. සාමාන්‍ය සිවිල් පාලනය, විදුලිය බලය, ජලය සැපයුම්, මාර්ග සහ ප්‍රවාහන සේවා නැවත ඇති කිරීම ප්‍රමුඛස්ථානය දිය යුතු කරුණු වේ. ආරක්ෂාව සහ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් වන්නා වූ තාර්කික වගේම පෙනීයන පරිද්දී බල කෙරෙන්නා වූ අවශ්‍යතා, අවතැන්වී සිටින්නන් අතුරෙන් සමාන අවශ්‍යතා ඇති ප්‍රවර්ගවල තරඟකාරී ඉල්ලීම් හෝ අවතැන්වූවන් සහ ඔවුන් තාවකාලිකව හෝ ස්ථිරව පදිංචි වී සිටින ප්‍රදේශවල ගෙදර අය අතර පවතින ආතතිය සහ මේවා නැවත පදිංචි කිරීම පිළිබඳ උගපෝකොටික ප්‍රශ්න අතර වෙති. තරග කරන්නා වූ කණ්ඩායම් ජනවාර්ගික නාට්‍ය, කුලය, ආගම්, භාෂාව, ගෝත්‍රික වශයෙන් පවතින සම්බන්ධකම් හෝ සමාජ පංතිය සහ කරුණු මත වෙනස් වූ විට මෙම ප්‍රශ්න විශේෂයෙන් බැරෑරුම් විය හැක. එවැනි කරුණු මානව හිතවාදී හා පුනරුත්ථාපන ක්‍රියා පිළිබඳ කමිටුවේ බලතල අතරට වැටේ, එහෙත් ඇතැම් ගැටළු ගැන විශේෂ සඳහනක් අවශ්‍ය වෙයි.

දෙපක්ෂයම එක් ජනවාර්ගික කණ්ඩායමකට අයත් වන අවස්ථාවලදී පවා ද ඉඩම්, ජලය, නිවාස පාසැල්, සෞඛ්‍ය සේවා, රැකියා සහ අනිකුත් ආර්ථික අවස්ථා සම්බන්ධයෙන් ආතතිය සහ වෛරය තිබීමට පුළුවන. විශේෂයෙන්ම අවතැන් වූවන් සහ නැවත පදිංචි කළ වුන් ඒ ප්‍රදේශවලට ''අයත්'' නොවන අය මෙන් දකිතොත් (නිදසුනක් වශයෙන් උතුරෙන් අවතැන්වී පුත්තලම් දිස්ත්‍රික්කයේ මුස්ලිම්වරුන් අතර පදිංචිව සිටින මුස්ලිම් ජනයා මේ ආකාරයට දකිනු ලැබීමට පුළුවන) මෙසේ වෙයි.

අවතැන්වී ඇති අය කල් යාමේදී සිය නිවෙස් සහ ඉඩම්වලට ආපසු පැමිණි විට වෙනත් ප්‍රදේශවලින් අවතැන් වූ අය ඒවායේ පදිංචිව සිටින බව හා ඔවුන් සිය නිවෙස්වලට යාමට කැමැත්තක් නොදක්වන බව පෙනී යන අවස්ථාවල විශාල ගැටළු සහිත වෙයි. ''බලෙන් පදිංචි කැනැත්තා'' සෑහෙන දුරට ඉඩම් සවිභූත්වයට පත්කිරීමට හා සංවර්ධනය කිරීමට සෑහෙන ආයෝජනයක් කර ඇත්නම් හෝ භුක්තියට පත්වීමේ අයිතිය ඉල්ලා සිටීමට තරම් ''බලෙන් අල්ලා ගැනීම'' කල් ගිය එකක් නම් එවිට මෙම ප්‍රශ්න ඉතා බැරෑරුම් වේ.

තම ගෙවල්වල අන්තනදා හමුදා පදිංචිව සිටින බව අත්අඩංගුවට ගත් අය දැනගත්විට හෝ තම ඉඩම් ''අධි ආරක්ෂිත'' තත්ත්වයට වර්ගකර ඇත්නම් හෝ උතුරෙන් පැන්නූ මුස්ලිම්වරුන්ගේ සහ නැගෙනහිර නොයෙක්

නගරවලින් පැන්නූ සිංහල, දෙමළ හා මුස්ලිම්වරුන්ගේ තත්ත්වය මෙන් ජනවාර්ගික ශුද්ධ කිරීමක් පිළිබඳ ඉතිහාසයක් තිබෙන තැන්වල අතිරේක දේශපාලන ගැටළු තිබේ.

## කාන්තාවන් සහ ළමයින්

සාම ක්‍රියාවලිය තුළ ලිංග භේද කරුණු සක්‍රිය අන්දමින් ඇතුළත් කිරීමට ඇති හැකියාව ගැන සොයා බැලීමට කාන්තා කමිටුවක් ඇති කරන බවට තුන්වන සාම සාකච්ඡා සැසිය අවසානයේ දී 2002 දෙසැම්බර් 5 වෙනි දින නෝර්වේ රාජ්‍යයෙන් නිකුත් කළ ප්‍රකාශය මගින් වාර්තා කරනු ලැබූ එකඟතාව ඉතා සාදරයෙන් පිළිගනු ලැබේ. “සන්නද්ධ අරගලය බලපා ඇති ළමයින්ගේ තත්ත්වය” දියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය දීම ද “ළමයි අයත් විය යුත්තේ තම පවුල්වල හෝ වෙනත් රැකබලා ගන්නන් වෙත මිස සිවිල් හෝ මිලිටරි වැඩ බිම්වල නොවේ” යන කාරණය පිළිගැනීම ද එපරිදිම සාදරයෙන් පිළිගත යුත්තකි. කාන්තාවන්ගේ සහ ළමයින්ගේ ගැටළු ගැන වෙනත් ප්‍රකාශනයක ඇතුළත් කරනු ලබන හෙයින් මෙහි දී ඒ ගැන දීර්ඝ ලෙස විස්තර නොකෙරේ.

## මානව අයිතිවාසිකම්, සුළුතර කොටස් සහ සාම ක්‍රියාවලිය

සුළුතර කොටස් ජනවාර්ගික පමණක්ම නොවන අතර විවිධ දේශපාලන මත ප්‍රකාශ කරන දේශපාලන පක්ෂ ද ඊට ඇතුළත් වෙයි. සියලු වර්ගවල සුළුතර කොටස්වල අයිතිවාසිකම් වැදගත්ය. දිවයිනේ සෑම කොටසකම පූර්ණ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස නැවත ස්ථාපනය කරන තුරු සමානත්වය ඇති වන්නේ නැත. තවද, මලයිකහ දෙමළ ජනයාට විශේෂයෙන් බලපා ඇති රටක් නැතිකම වූ කලී මානව අයිතිවාසිකම් පූර්ණ වශයෙන් අහිමි කිරීමක් වන අතර එය ඉවත් කළ යුතුය.

මානව අයිතිවාසිකම් බෙදා වෙන් කළ නොහැකි අතර ඒවා සාමයෙන් සහ ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම්වලින් සහ නන්වැදෑරුම් නිදහසෙන් වෙන්කළ නොහැක, මේවා ජනතාවගේ කිසියම් කොටසකට අහිමි කළොත් සියලු දෙනාටම එයින් බලපෑම් ඇතිවෙයි. තවද, මානව අයිතිවාසිකම් කියා පෑමට හැකි වන්නේ සාමය පවතින විට පමණි. උතුරු නැගෙනහිර සිටින හෝ එහි යන කිසිවෙකුටත් සිදුවී තිබෙන ප්‍රබල වෙනස්කම් නොදැක සිටීමට

නොපුළුවන. දිවයිනේ සියලු ප්‍රදේශවලින් පළමු වතාවට හෝ දශක දෙකකට වැඩි කාල පරිච්ඡේදයකට පසුව යන සිංහල ජනයා විශාල ගණනක් ද දශකයට හෝ ඒ වැනි කාලයකට පසුව අත්හැර ගිය සිය ගෙවල් දොරවල්, කෝවිල් සහ මුස්ලිම් දේවස්ථාන සොයා නැවත යන අවතැන්වූ දෙමළ හා මුස්ලිම්වරු ද වෙති. වැඩි වැඩියෙන් පිරිස් නැවත පදිංචි වෙමින් සිටින අතර වාණිජ්‍ය හෝ ආර්ථික ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට හෝ නැවත පටන් ගැනීමට සොයා බලමින් සිටිති. පිටරට සිට පැමිණෙන බොහෝ අය අතුරෙන් ඇතැමිහු ද එවැනි තෝරා ගැනීම් ගැන සිතා බලමින් සිටිනවා ඇත.

පරීක්ෂණ ස්ථාන පෙරට වඩා අඩු වී ඇති අතර, තවදුරටත් පවතින ස්ථානවල ආතතිය තැපී පෙනෙන අන්දමින් අඩුවී තිබේ. අවුරුදු ගණනාවකින් අවස්ථාවක් නොවූ අන්දමට ඒ ඒ ප්‍රදේශවල ජනයා පරීක්ෂණ ස්ථාන පසු කොට යති. යුද සහ එල්.ටී.ටී.ඊ. පිරිස් ද වඩා නිදහස් ලෙස එහා මෙහා යති. ඔවුන්ගෙන් බොහෝ අය අවි රැගෙන යන බවක් නොපෙනේ. 2001 අග දක්වා පැවති තත්ත්වයට වඩා මෙය පැහැදිලි වෙනසකි. ආතති පවතින හෝ වැඩිවීම් ද සිදු වූ ඇතැම් ප්‍රදේශ නැත්තේ නොවේ. බොහෝ ප්‍රශ්න පැවතිය හැකි අතර අවුරුදු ගණනක් තුළ දිගට ඇදී යාමට ඉඩ ඇත. එහෙත් සමස්තයක් වශයෙන් ධනාත්මක වෙනස්වීම් සිදුවී තිබේ. ගැටුම් මඟහැරීම අවශ්‍ය අතර සාම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමත් ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ප්‍රවර්ධනයත් සිදු විය යුතුය.

ISBN 955 - 582 - 100 - 3

Printed By: Unie Arts (Pvt) Ltd.